
2019
ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
தேசிய மொழிக் கல்வி மற்றும் பயிற்சி நிறுவனம்
National Institute of Language Education and Training
NILET

# ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

## වාර්ෂික වාර්තාව - 2019

## පටුන

අනු අංකය | විස්තරය | පිටු අංකය


01. ආයතනයේ පිහිටීම ....4

1.1 කොළඹ ප්‍රධාන කාර්යාලය ....4

02. ආයතනයෙහි පරමාර්ථ ....5

03. ආයතනයේ කර්තව්‍යයන් ....6

04. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි 2019 වර්ෂය සඳහා නිර්දේශිත කළමනාකරණ මණ්ඩල තොරතුරු ....7

05. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි 2019 වර්ෂය සඳහා නිර්දේශිත උපදේශක මණ්ඩල තොරතුරු ....08

06. 2019 වර්ෂය සඳහා නිර්දේශිත අධ්‍යයන මණ්ඩල සාමාජිකයන් ....9

6.1 අධ්‍යයන මණ්ඩලයේ කාර්යභාරය ....10

07. ආයතනයේ කාර්ය මණ්ඩලය - 2019 ....11

07.1. ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය ....12

08. ආයතනයේ සංයුතිය ....13

08.1 පාලන හා සැපයුම් අංශය ....14

08.2 සැලසුම් අංශය ....16

08.3 පුහුණු අංශය ....18

08.4 අභ්‍යන්තර විගණන අංශය ....29

08.5 ගිණුම් අංශය ....34

සභාපතිතුමාගේ පණිවිඩය




ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වත්මන් සභාපතිවරයා ලෙස ආයතනික වාර්ෂික වාර්තා සඳහා පණිවුඩයක් එක් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

2020 වර්ෂයේ පෙබරවාරි මස අගභාගයේ ඇරඹි මාගේ ධුර කාලයෙන් පසු ආයතනික අභිවෘද්ධිය අපේක්ෂාවෙන් ප්‍රතිසංවිධානය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. එහිදී ආයතනයේ ප්‍රධාන කාර්යයක් වන වාර්ෂික වාර්තා නිසි කලට සපයා නොතිබීම පිළිබඳව කරුණු සනාථ වූ අතර 2017 සිට 2019 දක්වා වාර්ෂික වාර්තා තුනක් ම කඩිනම්ව සකසා ඉදිරිපත් කිරීමට සිදුවූ බැවින් එම වාර්තා තුනටම මා හට පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

ඒ අනුව උක්ත වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය සක්‍රිය කළ අතර ඒ සඳහා අවශ්‍ය නියාමනය සහ මාර්ගෝපදේශකත්වය ලබා දෙමින් තත් කාර්ය සාර්ථකත්වයට පත් කිරීමට හැකිවීම මාගේ ප්‍රහර්ෂයට කරුණකි . එසේම අප විසින් ඉදිරිපත් කරන මෙම වාර්ෂික වාර්තා මේ වන විට ආයතනික වෙබ් අඩවිය ඔස්සේ පරිශීලනය කිරීමේ හැකියාවද සලසා ඇත.

තවද "සෞභාග්‍යයේ දැක්ම " යථාර්ථයක් කරනු වස් , ආයතනික මෙහෙවර ප්‍රකාශනයේද සඳහන් පරිදි ලාංකේය ජනතාව භාෂාන්තර ඥානයෙන් සන්නද්ධ කොට ඔවුන් අතර සංහිදියාව ප්‍රවර්ධනය කිරීමේ ජාතික කර්තව්‍ය වෙනුවෙන් පෙනී සිටින රජයේ සන්නාමලත් ආයතනය වන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අභිවෘධිය පිණිස මාගේ මෙම ප්‍රයත්නය හේතු වනු ඇතැයි මා විශ්වාස කරමි.

**සභාපති**

**ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද**

# 01.ආයතනයේ පිහිටීම

## 1.1) කොළඹ ප්‍රධාන කාර්යාලය

2019 වර්ෂයේ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි ප්‍රධාන පරිපාලන කටයුතු සිදුකරගෙන යනු ලැබුවේ අංක 321/1/A, හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය ලිපිනය දරන ස්ථානයෙහිය. දීප ව්‍යාප්ත, භාෂාව ඉගැන්වීම පිළිබඳ විවිධ පාඨමාලා සංවිධානය කිරීම සහ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, සියලු ආයතන හා අමාත්‍යාංශ සමඟ පහසුවෙන් කටයුතු කිරීම සහ ආයතනයෙහි සියලුම කර්තව්‍යන් වඩා පෘථුල වශයෙන් පවත්වාගෙන යාම සඳහා කොළඹ කාර්යාලය සංස්ථාපනය කර ඇත.

## 1.2) අගලවත්ත පුහුණු ආයතනය



ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි අගලවත්ත භාෂා මධ්‍යස්ථානය කොළඹ සිට කි.මී. 100ක් පමණ දුරින් කළුතර දිස්ත්‍රික්කයෙහි අගලවත්ත, ගලේවත්ත නම් ප්‍රදේශයෙහි ස්ථාපනය කොට ඇත.

ජාතික වැවිලි කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පැවති අක්කර 2.5ක පමණ භූමි ප්‍රමාණයක් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්න ලද තීරණයකින් අනතුරුව ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය වෙත පවරා ඇති අතර, ආයතනයෙහි ආරම්භක අවදිය හා වැඩිදියුණුව සඳහාත් භූමි පරිශ්‍රය ප්‍රභල ලෙස හේතු වී ඇත. භාෂා ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රියාවලිය වඩා සෞන්දර්යානන්දව, ප්‍රායෝගිකව සහ බුද්ධිවාදි ස්වරූපයෙන් සිදු කළ හැකි මනෝරම්‍ය වූ පරිසර සොභාවයකින් සහ මනස්කාන්ත භූමි නිමවුමකින් යුක්ත අගලවත්ත භාෂා පුහුණු මධ්‍යස්ථානය නේවාසිකව  ස්ථාපනය කර ඇත.

## 02.ආයතනයෙහි පරමාර්ථ







- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම ලබා ගැනීමට කැමැත්තෙන් සිටින්නේ යම් තැනැත්තෙක්ද එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහිකිරීම.

- ලිඛිත නීතියකින් පිහිටුවන ලද භාෂා පරිවර්තන සේවයෙන් සහ ජාතික භාෂණ පරිවර්තන සේවයෙන් පත් කළයුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුණතාවය ඇති පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තනයන් බිහි කිරීම.

- සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහි කිරීම.

- භාෂා පරිවර්තකයන්, භාෂණ පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහි කිරීම.

මහජනයාට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛභාෂා හැකියාව ඇති තැනැත්තන් පුහුණු කිරීම.

## 03.ආයතනයේ කර්තව්‍යයන්



- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන්හට සිංහල, දෙමළ ස ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ තැනැත්තන් බිහි කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දීර්ඝ පුහුණුවක් ලබාදීම.

- ආයතනයේ ක්‍රියාකාරිත්වය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා පර්යේෂණ හා අධ්‍යයනවල ප්‍රතිඵල භාවිත කිරීමේ අරමුණු ඇතිව භාෂා පුහුණු කිරීමට අදාළව පවතින ගැටළු පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන පැවැත්වීම.

- සුදුසු තැනැත්තන්ට භාෂා පුහුණුව සහ අධ්‍යාපනය ලබාදීම සහ ඒ පුහුණුවීම් සහ අධ්‍යාපනය සම්පූර්ණ කරන සාර්ථක අපේක්ෂාවන්ට සහතිකපත්‍ර හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.

- භාෂා ඉගැන්වීමේ කාර්යය සිදු කිරීම සඳහා පුහුණු පුද්ගලයන්ගේ සමන්විත මණ්ඩලයක් පිහිටුවීම.

- භාෂාවන්ට අදාළ කාරණා පිළිබඳ තොරතුරු තැම්පත් කර තබන ස්ථානයක් පිහිටුවීම.

- භාෂා පරිවර්තකයන්, භාෂණ පරිවර්තකයන් සහ ලඝු ලේඛකයින් ආදී වශයෙන් විශේෂ කාණ්ඩවලට අයත් තැනැත්තන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වලින් විශේෂිත භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම.

## 04._ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි 2019 වර්ෂය සඳහා නිර්දේශිත කළමනාකරණ මණ්ඩල තොරතුරු

ආයතනයෙහි පරමාර්ථ වඩා කාර්යක්ෂම සහ නිරවද්‍ය සිදුකරනු වස් අදාළ සියලුම තීරණවල තීරකයා වශයෙන් පෙනී සිටිනුයේ කළමනාකරණ මණ්ඩලයයි. 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතෙහි 3(1) වන වගන්තිය ප්‍රකාරව ගරු ඇමතිතුමා විසින් පහත සඳහන් කළමනකරණ මණ්ඩලය පත්කරනු ලැබ ඇත.

| අනු අංකය | නම | කාර්යාලීය ලිපිනය | පත්වීම් දිනය | ධුර කලය අවසන් වීම |
|---|---|---|---|---|
| **01** | ටී .බී.කේ.එම්. තෙන්නකෝන් මහතා | සභාපති, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය | 2018.04.25 | 2019.11.01 |
| **02** | ප්‍රසාත් ආර් හේරත් මහතා | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය | 2008.08.02 | |
| **03** | සංජීවනී වීරසේකර මිය | අධ්‍යක්ෂ, රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය, කොළඹ 07 | 2018.09.20- | 2019.06.28 |
| **04** | චරිතා ඉලංගකෝන් මෙය | අධ්‍යක්ෂ, ආයතන අංශය, රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය, කොළඹ 07 | 2019.07.29 | 2020.1.22 |
| **05** | ආර්කරුණාසිරි . මහතා | අධ්‍යක්ෂ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව, 2 වන මහල ,අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය බත්තරමුල්ල. | 2018.08.23 | 2019.10.10 |
| **06** | පීරාජපක්ෂ .එන් . මිය | අධ්‍යක්ෂ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව, 2 වන මහල, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය බත්තරමුල්ල. | 2019.10.10 | 2020.11.22 |
| **07** | ආචාර්ය එස් . දරන් මහතාශ්‍රී | සෞඛ්‍ය අමාත්‍යාංශය | 2017.07.25 | 2020.11.22 |
| **08** | ඩබ් කාචන්දි .ඩී .ඒ. රූපසිංහ | අතිරේක ලේකම් ජාතික (පාලන හා මුල්‍ය) සහජීවන, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශා, | 2017.12.15 | 2019.10.10 |
| **09** | එස්න් තෙයිවෙන්ද්‍ර . මිය | අතිරේක ලේකම් (භාෂා) ජාතික ඒකාබද්ධතා රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, | 2019.10.10 | 2020.11.22 |

| | | | | |
|---|---|---|---|---|
| **10** | පීහේමචන්ද්‍ර . | සංවිධාන හා ක්‍රම, 21 වන මහල, ප්‍රධාන කාර්යාලය, ලංකා බැංකුව, කොළඹ 01. | 2018.04.26 | 2020.11.22 |
| **11** | කේනගුලරාජා මිය . | රාමනාදන් හින්දු බාලිකා විද්‍යාලය, ලෝරන්ස් පාර, කොළඹ 04. | 2018.05.24 | 2020.11.22 |
| **12** | එස්.පී.ඒ.එම්.ජී. සේනාරත්න මිය | ගණකාධිකාරි, රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය. | 2018.06.21 | 2020.11.22 |
| **13** | ආචාර්ය එස්. ජේ . යෝගරාජා මහතා | වාග්විද්‍යා අංශය, කැළණිය විශ්ව විද්‍යාලය | 2018.12.31 | 2020.11.22 |

## 05. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි 2019 වර්ෂය සඳහා නිර්දේශිත උපදේශක මණ්ඩල තොරතුරු

| | | |
|---|---|---|
| **ටීතෙන්නකෝන් .බී.කේ.එම්. මහතා** | **සභාපති ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය.** | **2018.04.25** |
| **ප්‍රසාත් ආර්. හේරත්** | අධ්‍යක්ෂ ජනරාල් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය. | - |
| **ආචාර්ය අශෝක ප්‍රේමරත්න මහතා** | භාෂා වාග්විද්‍යා අංශය කැලණිය විශ්වවිද්‍යාලය. | 18-12-2018 |
| **ආචාර්ය කරුණානිධි මහතා** | අධ්‍යාපන අංශය, විශ්වවිද්‍යාලය | 18-12-2018 |
| **කරිමා ජයවීර මිය** | ඉංග්‍රීසි අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 18-12-2018 |
| **ආචාර්ය ඩබ්.එම්. විජේරත්න මහතා** | භාෂා වාග්විද්‍යා අංශය, කැළණිය විශ්ව විද්‍යාලය | 18-12-2018 |
| **මහාචාර්ය අමරකීර්ති ලියනගේ මහතා** | සිංහල අධයානංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 18-12-2018 |

## 06. 2019වර්ෂය සඳහා නිර්දේශිත අධ්‍යයන මණ්ඩල සාමාජිකයන්

2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන අංක 07 පරිච්ඡේදයට අදාළව ගරු අමාත්‍යතුමන් විසින් ආයතනයේ අධ්‍යයන කටයුතු වලදී සැලසුම්, ප්‍රතිපත්ති සහ නිර්දේශ සඳහා අවශ්‍ය කොන්දේසි සහ වෙනත් කාර්යයන් වඩා නිවැරදිව සහ කාර්යක්ෂමව සිදුකරනු වස් විවිධ විශ්වවිද්‍යාල නියෝජනය කරමින් භාෂාව, වාග් විද්‍යාව සහ අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර අළලා පහත අධ්‍යයන මණ්ඩල සාමාජිකයන් පත් කරන ලදුව ඇත. එම විශ්වවිද්‍යාලවල ආචාර්ය සහ මහාචාර්යවරුන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ සංස්ථාපිත විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු සිදු කරන, විශ්වවිද්‍යාල කොමිෂන් සභාවෙහි එකඟතාවයෙන් පත්කරන ලද අතර, ආයතනයෙහි ඉදිරි දැක්මෙහි ප්‍රධාන නියෝජිතයන් වශයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගනුවස් සෘජුව බැඳී සිටී.

| | |
|---|---|
| **ටී.එම්.කේ.බී තෙන්නකෝන්** | **සභාපති**<br>**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය** |
| **ප්‍රසාත්.ආර් හේරත්.මහතා** | අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය |
| **පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි** | අංශ ප්‍රධාන<br>සිංහල භාෂා අධ්‍යනාංශය ,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| **ආචාර්ය රත්නසිරි අරංගල මහතා** | සිංහල සහ ජන සන්නිවේදන අංශය<br>ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ. |
| **මහාචාර්ය දුෂ්සාන්ති මෙන්ඩිස් මිය** | අංශ ප්‍රධාන, ඉංග්‍රීසි අධ්‍යනාංශය කොළඹ ,<br>විශ්වවිද්‍යාලය |
| **මහාචාර්ය රමේෂ් අබ්දුල්ලා මහතා** | අග්නිදිග විශ්වවිද්‍යාලය, මඩකලපුව. |
| **කේ.එස්.ආර් පෙරේරා මිය** | කොමසාරිස්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,<br>,17/341<br>කෝට්ටේ පාර, රාජගිරිය. |
| **ආචාර්ය ආර් ජී..ඊ.ෆොන්සේකා මහතා** | අංශ ප්‍රධාන, ඉංග්‍රීසි අධ්‍යනාංශය ,<br>රුහුණු විශ්වවිද්‍යාලය |
| **ආචාර්ය වී. මහේෂ්වරන් මහතා** | අංශ ප්‍රධාන, දෙමළ අධ්‍යනාංශය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |

### 06.1 අධ්‍යයන මණ්ඩලයේ කාර්යභාරය

- ආයතනයේ අධ්‍යයන කටයුතුවලට අදාළ වියහැකි යම් යම් කරුණු පිළිබඳ පනතේ විධානයන්ට අනුව ආයතනයට උපදෙස් දීම.
- ආයතනයේ රීතිවලට අනුකූල විභාග පැවැත්වීම සහ විභාග සමත් වී ඇති සහ ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් කොන්දේසිවලින් සෑහීමකට පත්ව ඇති ඩිප්ලෝමා සහතිකපත් සහ ආයතනයේ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තන් පිළිබඳව කළමනාකරණ මණ්ඩල වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ආයතනය වෙත මණ්ඩලය විසින් යොමු කරන ලද කිසියම් කරුණක් පිළිබඳව වාර්තා සැලකිල්ලට ගැනීම.
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පුහුණු වැඩසටහන් සඳහා වූ පාඨමාලාවලට සහ විභාගවලට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පුහුණු වැඩසටහන් සඳහා වූ පාඨමාලාවලට අදාළ නීතිරීති සකස් කර කළමනාකරණ මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- ආයතනයේ අධ්‍යයන මණ්ඩල පත්කිරීම, ඉවත් කිරීම සහ විනය පාලනයට අදාළ නීති, බඳවා ගැනීමේ පටිපාටි, වේතන, පරිශ්‍රමික දීමනා සහ ගාස්තු සහ සේවා කාලය, නිවාඩු ආදිය පිළිබඳව කළමනකරණ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශිෂ්‍යත්ව ප්‍රදාන, ශිෂ්‍යාධාර පදක්කම් සහ ත්‍යාග සඳහා සපුරාලිය යුතු කොන්දේසි පිළිබඳව කළමනාකරණ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශිෂ්‍යත්ව ප්‍රදාන, ශිෂ්‍යාධාර පදක්කම් සහ ත්‍යාග සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද කොන්දේසි සපුරා ඇති තැනැත්තන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධ්‍යයන මණ්ඩලයේ අනු නියෝජිතයන්ගේ සෑදුම්ලත් කමිටු පත්කිරීම.

- කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්වලට අදාළ සහ එවැනි රැස්වීම්වලදී අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටීන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 7. ආයතනයේ කාර්ය මණ්ඩලය2019 -

ආයතනයේ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

කළමනාකරණ මණ්ඩලයෙහි විධානයන්ට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආයතනයෙහි පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලබයි.

1. ආයතනයේ පරිපාලන කටයුතු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳව වගකීම
2. ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලයෙහි පත්කිරීම්, ආයතනික පරිපාලන කටයුතු
3. ආයතනය විසින් පවත්වනු ලබන සියලුම පුහුණු වැඩසටහන් අධීක්ෂණය හා සම්බන්ධීකරණය

### 7.1 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

වර්ෂය තුලදී ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් සහ සේවක සංඛ්‍යා කමිටුවෙහි නිර්දේශ ලබාගනිමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතත් ආයතනයේ තනතුරු සංඛ්‍යාව මෙන්ව එම තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටින්ද අනුමත කර ගැනීමට හැකිවීම මඟින් ආයතනයට අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි තනතුරු 02ක් සහ සම්බන්ධිකරණ සහාකාර තනතුරු 01ක් හා කාර්යාල කාර්ය සහයක තනතුරු 01ක් සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන් විධිමත් පරිදි කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමට හැකිවිය.



## 07.2 ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය

| <u>තනතුරු නාමය</u> | <u>එකතුව</u> |
|---|---|
| 1. අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 2. අධ්‍යක්ෂ | 02 |
| 3. සහකාර අධ්‍යක්ෂ | 03 |
| 4. ගණකාධිකාරී | 01 |
| 5. අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි | 05 |
| 6. පරිපාලන නිලධාරී | 01 |
| 7. අභ්‍යන්තර විගණන නිලධාරි | 01 |
| 8. සම්බන්ධිකරණ සහකාර | 08 |
| 9. පුස්තකාලයාධිපති | 01 |
| 10. කළමනාකරණ සහකාර | 08 |
| 11. විදුලි කාර්මික හා පොම්ප ක්‍රියාකරු | 01 |
| 12. රියදුරු | 05 |
| 13. කාර්යාල කාර්ය සහායක | 04 |
| **මුළු එකතුව** | 41 |

ඉහත තනතුරු ප්‍රමාණය අනුමත කිරීමෙන් අනතුරුව ආයතනයේ පහත දක්වා ඇති පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවන ලදි.

| <u>තනතුරු නාමය</u> | <u>පුරප්පාඩු</u> |
|---|---|
| 1. අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි | 02 |
| 2. සම්බන්ධිකරණ සහකාර | 01 |
| 3. කළමනාකරණ සහකාර | 01 |

ඉහත තනතුරු වලට අදාළ ඉල්ලුම්පත්‍ර අනුව අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි, සම්බන්ධිකරණ සහකාර, කාර්යාල කාර්ය සහයක තනතුරු සඳහා නිලධාරීන් විධිමත්ව බඳවා ගන්නා ලදි.

**මේ අනුව 2019 වර්ෂය අවසානයේදී ආයතනයේ සේවයේ යෙදී සිටි කාර්ය මණ්ඩලය පහත පරිදි වේ .**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| 1. අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 2. අධ්‍යක්ෂ | 01 |
| 3. සහකාර අධ්‍යක්ෂ | 03 |
| 4. ගණකාධිකාරි | 01 |
| 5. අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි | 05 |
| 6. පරිපාලන නිලධාරි | 01 |
| 7. අභ්‍යන්තර විගණන නිලධාරි | 01 |
| 8. සම්බන්ධීකරණ සහකාර | 06 |
| 9. කළමනාකරණ සහකාර | 08 |
| 10. රියදුරු | 03 |
| 11. කාර්යාල කාර්ය සහායක | 04 |
| **මුළු එකතුව** | **34** |

## 08. ආයතනයේ සංයුතිය

ආයතනයෙහි කාර්යයන් ඉටුකර ගැනීමේ පහසුව සඳහා එය පහත සඳහන් අංශවලට වෙන් කර ඇත.

- පාලන හා සැපයුම් අංශය
- සැලසුම් අංශය
- පුහුණු අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ගිණුම් අංශය

## 08.1 පාලන හා සැපයුම් අංශය

ආයතනයේ කාර්ය මණ්ඩලයට අදාළ සියලුම පරිපාලන හා ආයතනික කටයුතු සිදු කිරීම මෙම අංශය මඟින් සිදු කරයි. ආයතනයේ සෙසු අංශවල කාර්යයන් බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් සපයා දෙමින්, අංශ අතර සම්බන්ධීකරණ කටයතු මනාව පවත්වාගෙන යාමද පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.

එසේම ආයතනයේ අනෙකුත් සියලුම අංශවලට අවශ්‍ය කාර්යමණ්ඩලය නියමිත කාර්ය පටිපාටින් ඔස්සේ බඳවා ගැනීම, ඔවුන්ගේ ආයතනික සහ පරිපාලනමය කටයුතු ඉටුකරමින් සේවක සුබසාධනයත්, සේවක අභිප්‍රේරණයත් නංවාලමින් ඒ ඒ අංශවල කටයුතු ඵලදායි අන්දමින් කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය මුලික පහසුකම් සැලසීමද කාර්යයෙහි නියුක්තව සිටීමද පාලන අංශය මඟින් සිදු කරන කාර්යයකි.

පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය වන පුහුණු උපකරණ සහ ආයතනයේ සියලුම අංශවලට අවශ්‍ය වන පරිගණක යන්ත්‍ර මෙන්ම කාර්යාලයට දෛනිකව අවශ්‍ය වන කාර්යාල උපකරණ, ලිපි ද්‍රව්‍ය ආදිය මිලදී ගැනීමටද, වාහන නඩත්තු, ප්‍රවාහන පහසුකම් සැපයීම, ආරක්ෂක සේවාවන් සහ පිරිසිදු කිරීමේ සේවා සම්පාදනය කිරීම ආදී සියලුම ප්‍රසම්පාදන කටයුතු ඉටුකරනු ලබන්නේද මෙම අංශය විසිනි. එමෙන්ම ආයතනයේ පුස්තකාලය හා ප්‍රලේකන මධ්‍යස්ථානය පරිපාලන අංශය යටතේ ක්‍රියාත්මක වේ.

.



# පුස්තකාලය හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය හා ඊට අනුබද්ධ පුහුණු ආයතනයේ පුහුණු පාඨමාලා පවත්වාගෙන යන සම්පත්දායකයන්ට, පුහුණු පාඨමාලා සඳහා සහභාගිවන්නන්ට සහ පුහුණු පාඨමාලා පවත්වාගෙන යාම සඳහා සහාය වන ආයතනයේ කාර්ය මණ්ඩලයට දැනුම සහ තොරතුරු රැස්කර ගැනීම සඳහා ඉගෙන ගැනීමේ පහසුකම් පුස්තකාලය මඟින් සපයාගත හැකිය.

භාෂා පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා විශේෂයෙන් උපකාරී වන විශේෂ පොත්පත්වලින් පරිපූර්ණ වී ඇති මෙම පුස්තකාලය පරිපාලන කළමනාකරණය, ගිණුම්කරණය, තොරතුරු තාක්ෂණය, භාෂාව, සාහිත්‍යය සහ සමාජ විද්‍යාව ආදී විෂයන් ආශ්‍රිත පොත්පත් සහ සඟරාවලින් සමන්විත වේ.

මෙයට අමතරව මෙම පුස්තකාලය ජාතික භාෂා ඉගැන්වීමේ ක්‍රියාවලියේදී අත්‍යවශ්‍ය උපකාර ග්‍රන්ථ, ශබ්දකෝෂ, විශ්වකෝෂ, පාරිභාෂික පදමාලා හා වාග්කෝෂ ආදී විමර්ශන කෘති, මෙන්ම පුහුණුවීම් සහ පුහුණු කිරීම්වලට අදාළ මෙවලම් කට්ටල, හා විවිධ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ එකතුවකින්ද යුක්ත වේ.

මේ හැර දෙවන භාෂාවක් අධ්‍යයනය කිරීමේදී අවශ්‍ය වන ග්‍රන්ථ හා විමර්ශන ද්‍රව්‍ය පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක්ද මෙහි පවතී. චරිත ප්‍රධාන සහ අනුක්‍රමික සම්පාදනය මෙම පුස්තකාලය මඟින් ඉටු කරන තවත් සේවාවකි. මෙයට අමතරව භාෂාවලට අදාළ වූ කරුණු පිළිබඳ ප්‍රලේඛන මධ්‍යස්ථානයක් ලෙස විවිධ භාෂා පිළිබඳ ජාතික වශයෙන් සිදු කරන පර්යේෂණ සහ අධ්‍යයන සම්බන්ධයෙන් වූ පොත් එකතුවක්ද පුස්තකාලය සඳහා යාවත්කාලීන කර ඇත.



## 7.5 සැලසුම් අංශය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ සඳහන් අරමුණු සහ පරාමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම මෙම අංශයේ ප්‍රමුඛ වගකීම වේ.

පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ඇතුළු සැලසුම් සකස් කිරීම, මාසික ප්‍රගති වාර්තා, කාර්තු ප්‍රගති වාර්තා, වර්ෂ අවසානයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම සහ එම වාර්තා අදාළ අංශ වෙත යොමු කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ.

ඉහත කාර්යයන්ට අමතරව පවරනු ලබන විශේෂ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීමද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

## <u>ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය</u>

## <u>වාර්ෂික කාර්ය සාධන වාර්තාව -2019</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ත්‍රෛ භාෂා සංකල්පය ක්‍රියාවට නැංවීමේ අරමුණින් ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් 2007 අංක 26 දරණ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනත අනුව ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය ප්‍රතිෂ්ඨාපනය කර ඇත.

ආරම්භයේදී එනම් 2007 නොවැම්බර් මස පළමුවැනි දින සිට මෙම ආයතනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ විෂයපථය යටතට ගැණුනු අතර ආයතනය එම අමාත්‍යාංශය පිහිටි, කොළඹ 03 ගාලු පාරේ අංක 310 යන ස්ථානයේ පවත්වාගෙන යන ලදි. 2010 අප්‍රේල් මස 25 වෙනි දින සිට අමාත්‍යාංශය ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය වශයෙන් නාම ගත කරන ලද අතර, මෙම ආයතනය එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන අතරට එක් විය.

2011 නොවැම්බර් 15 දින සිට ආයතනයේ ප්‍රධාන කාර්යාලය අංක 155/A, කාසල් වීදිය, කොළඹ 08 යන ස්ථානයේ පවත්වාගෙන ගිය අතර ,2013 සැප්තැම්බර් මස 03 වෙනි දින සිට 2015 පෙබරවාරි 28 දින දක්වා දෙවන මහළ, ගොඩනැගිලි අංක 09, බණ්ඩාරණායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07 යන ස්ථානයේද, 2017 මැයි 30 දින දක්වා අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය යන ස්ථානයේ පවත්වා ගෙන යන ලද අතර වර්තමානය වන විට අංක 321/1/A, හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබයි. මේ වන විට ආයතනය තම අරමුණු ඉටුකර ගැනීම සඳහා විශේෂ වැඩසටහන් හා පුහුණු පාඨමාලා දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරමින් පවතී. ඒවා අතරින් පහත සඳහන් වැඩසටහන් ප්‍රධාන වේ.

- සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන් වලට අදාල විෂය නිර්දේශ පිළියෙල කිරීම.
- සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීම.
- දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සහ දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව ක්‍රියාත්මක කිරීම.
- ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සම්පත් දායකයින් සඳහා පසු විපරම් සහ නියාමන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- භාෂා පරිවර්තනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා / ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිලධාරින් සඳහා අර්ධ කාලීන දෙවන භාෂා පුහුණු පාඨමාලා (I මට්ටම, II මට්ටම, III මට්ටම සහ IV මට්ටම)ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය නිලධාරීන් සහ අ.පො.ස (උ.පෙළ) නිම කළ සිසුන් සඳහා දින 12නේවාසික / නේවාසික නොවන කෙටි කාලීන භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- අලුතින් බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා සිමාවාසික කාලය තුළ දී කෙටිකාලීන දෙවන භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම. (වෛද්‍යවරුන්, ඉංජිනේරු වෘත්තිකයන් සහ අනෙකුත් වෘත්තිකයන් සඳහා)
- ගුවන් විදුලි නාලිකා හරහා භාෂා පුහුණු වැඩසටහන් ප්‍රචාරණය කිරීම.
- අ.පො.ස (සා.පෙළ) දෙවන භාෂා විෂය සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.

ආයතනය මඟින් සංවිධානය කරනු ලබන නේවාසික පාඨමාලා රාශියක් ගලේවත්ත, අගලවත්ත පිහිටි පුහුණු මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කරනු ලැබේ. රමණීය භූමි භාගයක පිහිටි මෙම පුහුණු ආයතනය පුහුණුවන්නන් 250ට පමණ එකවර සහභාගිවිය හැකි දේශන ශාලාවකින් ද, 30 දෙනෙකුට සහභාගී විය හැකි භාෂා විද්‍යාගාරයකින් ද, 60 දෙනෙකුට නවාතැන් පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරයකින් හා පුස්තකාලයකින් ද සමන්විත වේ

ඉහතින් සඳහන් කරන ලද පාඨමාලා දිපව්‍යාප්ව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවීණ සම්පත්දායක මණ්ඩලයක දායකත්වය ලබාගන්නා අතර ආයතනයේ කාර්ය මණ්ඩලයද ඒ සඳහා ඉමහත් කැපවීමකින් යුතුව කටයුතු කරනු ලබයි.

<u>දැක්ම</u>

ජාතික භාෂා පුහුණුව තුළින් ශ්‍රී ලාංකීය ජනතාව අතර සාමය සහ සහජීවනය වර්ධනය කිරීම.

## මෙහෙවර

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස භාෂා අධ්‍යාපනය සහ පුහුණුව සඳහා තෙයි භාෂා දැනුම් සම්පාදන කේන්ද්‍රස්ථානය ලෙසින් කටයුතු කිරීම.

## අරමුණු

**1.සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම් ලබා ගැනීමට කැමැත්තෙන් සිටින්නේ යම් තැනැත්තෙක් ද එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහි කිරීම.**

**2.ලිඛිත නීතියකින් පිහිටුවන ලද ජාතික භාෂා පරිවර්තක සේවයෙන් පත් කළ යුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුණතාවයන් ඇති පරිවර්තකයින් සහ භාෂණ පරිවර්තකයින් බිහිකිරීම.**

**3.සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා වලින් භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තනයින් සහ භාෂණ පරිවර්තකයින් පුහුණු කිරීමට සුදුසුකම් ලත් ගුරුවරුන් බිහිකිරීම.**

**4.මහජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛයි භාෂා හැකියාව ඇති තැනැත්තන් පුහුණු කිරීම.**

## 2019 වර්ෂය තුළදී ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද විවිධ පුහුණු පාඨමාලා සහ වැඩසටහන්

- **සැලසුම් සැසි**

ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන භාෂා වැඩසටහන් වලට අදාලව විෂය මාලා, මොඩියුල පිළියෙල කිරීම සම්බන්ධව භාෂා විෂය කේෂ්ත්‍රය පිලිබඳ දැනුමක් ඇති විශ්ව විද්‍යාල මහාචාර්ය, ආචාර්යවරු ඇතුළුව සම්පත්දායකයින්ගේ සහභාගිත්වයෙන් මෙම සැසි 14ක් 2019 වර්ෂය තුල පවත්වා ඇති අතර, ඒ සඳහා රු.553,000ක මුදලක් වැය වී ඇත.

## 08.2 පුහුණු අංශය

- **ගුරු පුහුණු වැඩසටහන්**

ආයතනය මගින් දීප ව්‍යාප්තව සංවිධානය කරණු ලබන භාෂා පුහුණු පාඨමාලාවල ඉගැන්වීමට සුදුසුකම් ලබන්නේ දින 05නේවාසික ගුරු පුහුණු වැඩසටහනට සහභාගිවී ඉන් සමත්වන ගුරුවරුන් පමණි .මෙම ගුරුවරුන් හෘදයාංගමව බැඳුණු ආවර්ජිත සහභාගීත්ව හා ඉගැන්වීම් ක්‍රියාවලිlective Participatory Ref)

(Heart Holding Teaching Process උපයෝගී කරගනිමින් ඉගැන්වීම් කටයුතුවල නිරත වේ .රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නිළධාරීන් හට දෙවන භාෂාව ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහිකිරීමත් සාමාන්‍ය ප්‍රජාවට භාෂා ප්‍රවීණතාවය ලබා දීමට හැකි ගුරු මණ්ඩලයක් බිහි කිරීමත් මෙවැනි වැඩසටහන් පැවැත්වීමෙහි අරමුණයි .

මෙම වැඩසටහන සඳහා පාඨමාලාලාභීන්ගෙන් මුදල් අයකරනු ලබනු අතර 2019 වසර තුළ ද මෙවැනි වැඩසටහනක් පවත්වා ඇති අතර එමගින් ගුරුවරුන් 200 දෙනෙකු පුහුණු කර ඇත. මේ සඳහා රු.517,935.00ක මුදලක් වැය වී ඇත.

**2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද පැය 150 ආදායම් උත්පාදිත නේවාසික ගුරු පුහුණු පාඨමාලා**

| අනු අංකය | ස්ථානය | පාඨමාලාගණන | පාඨමාලාලාභීන්ගණන | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|---|
| **1** | අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය | 1 | 200 | 750,000.00 | 517,935.00 |
| මුළු එකතුව | | **1** | **200** | **750,000.00** | **517,935.00** |

- <u>ගුරුවරුන් සඳහා අධීක්ෂණය සහ ඇගයීම වැඩසටහන්</u>

දෙවන භාෂා උගන්වන ගුරුවරුන්ගේ දැනුම ආකල්ප කුසලතා වර්ධනය කිරීමේ අරමුණ ඇතිව දින දෙකක වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ 2019 වර්ෂය තුල පසු විපරම් හා නියාමන වැඩසටහන් 12ක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා රු.12,863,000.00ක මුදලක් වැය විය.මේ සඳහා සම්පත්දායකයන් 1162 දෙනෙකු සහභාගී වී ඇත.

- <u>රාජ්‍ය නිලධාරීන් සඳහා පවත්වන (දින 06) (පැය 50) නේවාසික නොවන සිංහල / දෙමළ භාෂා පුහුණු වැඩසටහන</u>

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 1/2014 (IV) දරණ චක්‍ර ලේඛණය මගින් වයස අවුරුදු 50ට වැඩි සහ ප්‍රාථමික ගණයේ සියළු නිලධාරින් පැය 50ක භාෂා පුහුණු පාඨමාලාවක් හැදෑරීම

මගින් භාෂා ප්‍රවීණතා විභාගයෙන් නිදහස් වේ. එසේම ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන්ද මෙම ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන පැය 50 පාඨමාලාව හැදෑරීම මගින් ඉහත විභාගයෙන් නිදහස් වේ.

ඒ අනුව 2019 වර්ෂය තුළදී මෙම පාඨමාලා 79ක් භාණ්ඩාගාර අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලදී.




**2019 වර්ෂය තුල භාණ්ඩාගාර අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද (දින 06) (පැය 50) භාෂා පුහුණු වැඩසටහන්.**

**(දිස්ත්‍රික් මට්ටමින්)**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාඨමාලාගණන | පාඨමාලාලාභීන් ගණන | වියදම (රු.) |
|---|---|---|---|---|
| **1** | කොළඹ | 7 | 1151 | 378,635.00 |
| **2** | ගම්පහ | 3 | 449 | 195,690.00 |
| **3** | කළුතර | 6 | 1453 | 463,462.40 |
| **4** | හම්බන්තොට | 3 | 284 | 154,980.00 |
| **5** | මන්නාරම | 3 | 174 | 164,695.00 |
| **6** | මඩකලපුව | 4 | 432 | 255,385.00 |

| | | | | |
|---|---|---|---|---|
| **7** | ත්‍රිකුණාමලය | 2 | 200 | 83,790.00 |
| **8** | අම්පාර | 4 | 425 | 203,590.00 |
| **9** | මහනුවර | 7 | 891 | 346,338.00 |
| **10** | මාතලේ | 4 | 374 | 216,110.00 |
| **11** | නුවරඑළිය | 1 | 267 | 45,880.00 |
| **12** | අනුරාධපුරය | 3 | 337 | 175,800.00 |
| **13** | පොළොන්නරුව | 1 | 69 | 43,085.00 |
| **14** | කුරුණෑගල | 8 | 622 | 413,130.00 |
| **15** | පුත්තලම | 1 | 90 | 60,755.00 |
| **16** | බදුල්ල | 8 | 833 | 494,855.00 |
| **17** | මොණරාගල | 4 | 566 | 219,795.00 |
| **18** | රත්නපුර | 4 | 451 | 231,479.00 |
| **19** | කෑගල්ල | 6 | 446 | 242,138.00 |
| **මුළු එකතුව** | | **83** | **9,514** | **4,389,592.40** |

**2019 වර්ෂය තුළ ගාස්තු අයකර ක්‍රියාත්මක කරන ලද (දින 06 ) (පැය 50) භාෂා පුහුණු පාඨමාලා.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාඨමාලා ගණන | පාඨමාලාලාභීන් ගණන | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|---|
| **1** | නාවික හමුදා ප්‍රධාන කාර්යාලය | 2 | 155 | 320,000.00 | 114,024.00 |
| **2** | ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 1 | 52 | 156,000.00 | 23,535,00 |
| **3** | අධ්‍යයන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 1 | 34 | 102,000.00 | 25,140.00 |
| **4** | කම්කරු දෙපාර්තමේන්තුව | 1 | 28 | 112,000.00 | 48,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **5** | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 | 102 | 204,000.00 | 84,070.00 |
| මුළු එකතුව | | **6** | **371** | **894,000.00** | **294,769.00** |

- **<u>දින 12 (පැය 100) නේවාසික නොවන සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා</u>**

සංස්කෘතික හා සමාජ ඒකාබද්ධතාව උදෙසා මානව දයාවෙන් හා සහජීවනයෙන් පිරිපුන් රාජ්‍ය නිලධාරීන් නිර්මාණය කිරීමට ආයතනය ගන්නා අග්‍රගන්‍ය උත්සාහයක් ලෙස මෙම දින 12 කෙටි කාලීන භාෂා පුහුණු පාඨමාලාව හැඳින්විය හැකිය. මෙම පාඨමාලාවට සම්බන්ධවන නිලධාරීන් දින 12ක කාලසීමාවක් පාඨමාලාව සඳහා සහභාගිවිය යුතු අතර පාඨමාලාව අවසානයේ පවත්වනු ලබන විධිමත් ලිඛිත හා වාචික ඇගයීම මත සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ.

එසේම රාජ්‍ය පරිපාලන චක්‍රලේක අංක 1/2014/1V මගින් අවුරුදු 50ට වඩා ඉහළ රාජ්‍ය නිලධාරීන් මෙම ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන පැය 100 පාඨමාලාව හැදෑරීම මගින් භාෂා ප්‍රවීණතා විභාගයෙන් නිදහස් වේ. ඒ අනුව 2019 වර්ෂය තුල මෙම ආයතනය මගින් පැය100 පාඨමාලා 85ක් ක්‍රියාත්මක කරන ලදී. මින් පාඨමාලා 2ක් මුදල් අයකර ක්‍රියාත්මක කරන ලද අතර පාඨමාලා 83ක් භාණ්ඩාගාර අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන ලදී.

**2019 වර්ෂය තුළ භාණ්ඩාගාර අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන ලද දින 12 (පැය100) භාෂා පුහුණු පාඨමාලා.**
**(දිස්ත්‍රික්මට්ටමින්)**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාඨමාලාගණන | පාඨමාලාලාභීන් ගණන | වියදම (රු.) |
|---|---|---|---|---|
| **1** | කොළඹ | 2 | 254 | 159,063.00 |
| **2** | ගම්පහ | 4 | 363 | 315,726.00 |
| **3** | කළුතර | 3 | 185 | 219,474.00 |
| **4** | ගාල්ල | 5 | 426 | 457,586.00 |
| **5** | මාතර | 2 | 252 | 244,073.00 |
| **6** | හම්බන්තොට | 3 | 278 | 258,862.00 |
| **7** | යාපනය | 5 | 362 | 451,069.43 |

| | | | | |
|---|---|---|---|---|
| **8** | කිලිනොච්චි | 5 | 260 | 323,351.00 |
| **9** | මුලතිව් | 5 | 298 | 342,270.00 |
| **10** | මන්නාරම | 1 | 39 | 53,894.00 |
| **11** | වව්නියාව | 4 | 346 | 375,058.00 |
| **12** | මඩකලපුව | 2 | 112 | 157,708.00 |
| **13** | ත්‍රිකුණාමලය | 1 | 47 | 39,534.00 |
| **14** | අම්පාර | 3 | 332 | 351,207.00 |
| **15** | මහනුවර | 6 | 494 | 557,433.00 |
| **16** | මාතලේ | 2 | 164 | 231,528.00 |
| **17** | නුවරඑළිය | 1 | 115 | 111,074.00 |
| **18** | අනුරාධපුරය | 3 | 291 | 345,357.00 |
| **19** | කුරුණෑගල | 8 | 669 | 863,816.20 |
| **20** | පුත්තලම | 1 | 93 | 91,488.10 |
| **21** | බදුල්ල | 5 | 636 | 605,810.00 |
| **22** | මොණරාගල | 1 | 157 | 164,140.00 |
| **23** | රත්නපුර | 7 | 385 | 423,616.00 |
| **24** | කෑගල්ල | 4 | 714 | 353,714.00 |
| | **මුළු එකතුව** | **83** | **7272** | **7,496,851.73** |

**2019 වර්ෂය තුළ ගාස්තු අයකර ක්‍රියාත්මක කරන ලද දින 12 (පැය100) භාෂා පුහුණු පාඨමාලා.**

| **අනු අංකය** | **දිස්ත්‍රික්කය** | **පාඨමාලා ගණන** | **පාඨමාලාලාභීන් ගණන** | **ආදායම (රු.)** | **වියදම (රු.)** |
|---|---|---|---|---|---|
| **1** | විදුලිබල මණ්ඩලය මොණරාගල | 2 | 122 | 610,000.00 | 171,760.00 |
| **2** | විදුලිබල මණ්ඩලය ගාල්ල | 1 | 52 | 260,000.00 | 96,284.00 |
| **මුළු එකතුව** | | **3** | **174** | **870,000.00** | **268,044.00** |

**විවිධ වෘත්තිකයන් සඳහා පවත්වනු ලබන පැය 150 භාෂා පුහුණු පාඨමාලා**

විවිධ ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු වෘත්තිකයන් ඉලක්ක කරගෙන මෙම පාඨමාලාව නේවාසික / අනේවාසිකව ක්‍රියාත්මක කෙරේ .මෙහිදී විශේෂයෙන්ම අලුතින් පත්වීම් ලබන වෛද්‍ය නිලධාරින්, ඉංජිනේරුවන්, රේගු නිලධාරීන්, ශිල්පීය නිලධාරීන් ප්‍රධාන වේ.



- **භාණ්ඩාගාර අරමුදල් මඟින් 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද පැය 150 නේවාසික නොවන දෙවන භාෂා පාඨමාලා**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාඨමාලා ගණන | පාඨමාලාලාභීන් ගණන | වියදම (රු.) |
|---|---|---|---|---|
| **1** | මහනුවර | 2 | 177 | 248,441.36 |
| මුළු එකතුව | | **2** | **177** | **248,441.36** |
| | | | | |

- **2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද පැය 150 ආදායම් උත්පාදන නේවාසික නොවන දෙවන භාෂා පාඨමාලා**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාඨමාලාලාභීන්ගණන | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|
| **1** | වයඹ ආයුර්වේද දෙපාර්තමේන්තුව | 60 | 600,000.00 | 159,974.00 |
| **2** | කුරුණෑගල මහ රෝහල | 80 | 800,000.00 | 168,314.00 |
| **3** | කුලියාපිටිය බටහිර | 68 | 680,000.00 | 149,229.00 |
| **4** | පොළොන්නරුව මහ රෝහල | 62 | 620,000.00 | 187,214.00 |
| **5** | යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 90 | 900,000.00 | 123,934.36 |
| **6** | දියතලාව මිනින්දෝරු කාර්යාලය | 87 | 870,000.00 | 124,507.00 |
| **7** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යාපනය | 34 | 250,000.00 | 117,084.00 |
| **8** | බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය | 63 | 630,000.00 | 132,779.00 |
| **9** | දේශීය වෛද්‍ය ජාතික ආයතනය | 60 | 600,000.00 | 110,454.72 |
| **10** | ආයුර්වේද ශික්ෂණ රෝහල බොරැල්ල | 63 | 630,000.00 | 113,490.00 |
| **11** | ද සොයිසා රෝහල | 52 | 520,000.00 | 110,554.00 |
| **12** | කාසල් විදියේ කාන්තා රෝහල | 50 | 500,000.00 | 107,134.00 |
| **13** | රිජ්වේ ආර්ය ළමා රෝහල | 52 | 520,000.00 | 110,034.00 |
| | **මුළු එකතුව** | **821** | **8,120,000.00** | **1,714,702.08** |

- **2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද පැය 150 ආදායම් උත්පාදිත නේවාසික දෙවන භාෂා පාඨමාලා.**

| අනු අංක | ස්ථානය | පාඨමාලාව | පාඨමාලා ගණන | පාඨමාලා ලාභීන් ගණන | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|---|---|
| **1** | අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය | වෛද්‍යවරුන්ගේ වැඩසටහන | 10 | 699 | 17,475,000.00 | 7,725,775.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **2** | අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය | විද්‍යාත්මක නිලධාරීන්ගේ වැඩසටහන | 1 | 43 | 1,075,000.00 | 630,341.00 |
| **3** | අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය | ඉන්ජිනේරුවන්ගේ වැඩසටහන | 2 | 91 | 2,275,000.00 | 488,697.00 |
| **4** | අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය | රජයේ මිනින්දෝරුවන් ගේ වැඩසටහන. | 2 | 114 | 2,850,000.00 | 1,233,135.00 |
| | **මුළු එකතුව** | | **15** | **947** | **23,675,000.00** | **10,641,487.00** |

- ***<u>උසස් පෙළ සිසුන් සඳහා දෙවන භාෂා කඳවුරු</u>***

අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් දරු දැරියන්ට සිංහල ,දෙමළ භාෂා ඉගෙන ගැනීම කෙරෙහි උනන්දුවක් ඇති කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. දින 2 ක් තුළදී පළාත් මට්ටමින් මෙම භාෂා කඳවුරු ක්‍රියාත්මක කරන ලද අතර මේ සඳහා ආයතනයේ පුහුණුව ලද විශේෂ ගුරු මණ්ඩලයක් විසින් සම්පත්දායකත්වය සපයන ලදී.

2019 වර්ෂය තුළදී  මෙම වැඩසටහන් 3ක් ක්‍රියාත්මක කරන ලද අතර මේ සඳහා රු: 495,030.00ක මුදලක් වැය විය.

- **2019  වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද උසස් පෙළ සිසුන් සඳහා භාෂා කඳවුරු.**

| අනු අංකය | ස්ථානය | පාඨමාලා ගණන | පාඨමාලාලාභීන් ගණන | වියදම (රු.) |
|---|---|---|---|---|
| **1** | අල්- හර්ෂත් මහ විද්‍යාලය අම්පාර | 2 | 447 | 304,950.00 |
| **2** | සෙන්ගලව් මහා විද්‍යාලය සයින්දමරුදු | 1 | 300 | 190,080.00 |
| **මුළු එකතුව** | | **3** | **747** | **495,030.00** |

- ***"දන්නවා නම් උගන්වන්න , දන්නැත්තම් ඉගෙනගන්න"*** **ගුවන් විදුලි වැඩසටහන**

අ.පො.ස (සා.පෙළ) දෙවන භාෂා ඉලක්ක කර ගනිමින් 2016 වර්ෂයතුළ දී ආරම්භ කරන ලද මෙම වැඩසටහන 2019 වර්ෂය තුළ දී ද ක්‍රියාත්මක විය.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිංහල සහ දෙමළ සේවය ඇතුළුව ප්‍රාදේශිය සේවා 9ක් ඔස්සේ වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය මල්ලිකා දේවනාරායාන මහත්මියගේ සම්පත්දායකත්වය ලබා ගන්නා ලදී. මෙම වැඩසටහන සඳහා ප්‍රචාරණ වියදම් ඇතුළුව 2019 වර්ෂය තුළ දී රු: 153,239.00/=ක මුදලක් වැය කර ඇත.

මිට අමතරව භාෂාව ඉගැන්වීම වඩාත් පුළුල් කිරීම සඳහා රූපවාහිනී නාලිකා ඔස්සේ භාෂා අසමු වැඩසටහනේ 2019 වර්ෂය තුලද විකාශනය කරන ලද අතර ඒ සඳහා රු.4,340,000.00/=ක මුදලක් වැයකර ඇත.

- ***"දන්නවා නම් උගන්වන්න , දන්නැත්තම් ඉගෙනගන්න"*** **ගුවන් විදුලි වැඩසටහනට සමගාමීව පවත්වන ලද අ.පො.ස (සා.පෙළ) දෙවන භාෂා සම්මන්ත්‍රණ මාලාව**

මෙම ආයතනය සහ ජාතික සහජීවනය සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය හා එක්ව 2019 වර්ෂයේ අ.පො.ස (සා.පෙළ) දෙවන භාෂාව සඳහා පෙනී සිටින දරු දැරියන්ට එක් දිනක විශේෂ සම්මන්ත්‍රණ මාලාවක් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී.

මෙම සම්මන්ත්‍රණ මාලාව සඳහා ගුරුඅත්පොත් සහ සිසුන් සඳහා පුණරීක්ෂණ අත්පොත් පිළියෙළ කොට **uqøKh** කිරීම ආයතනය විසින් සිදුකරන ලදී. මේ සඳහා අදාළ විශේෂඥයන්ගේ සහ ආයතනයෙහි **wOHhk** හා පර්යේෂණ නිලධාරීන්ගේ සම්පූර්ණ දායකත්වය ලබාගන්නා ලද අතර, මෙම කාර්යයටද රු:1,072,770.00ක මුදලක් වැය විය.

සම්මන්ත්‍රණ මාලාව සඳහා ආයතනයේ ලියාපදිංචි ගුරුවරුන් අතරින් විශේෂ කණ්ඩායමක් යොදවා ගන්නා ලද අතර ඔවුන්ට අධ්‍යයන මණ්ඩලය මගින් විශේෂ ගුරු පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

මුළු දිවනයිනම ආවරණය වන පරිදි ලැබී ඇති ඉල්ලීම් සලකා බලා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, සම්මන්ත්‍රණමාලා 5ක් ද අනුව ක්‍රියාත්මක කරන ලදී.

**2019 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද අ.පො.ස )සා.පෙළ (දෙවන භාෂා සම්මන්ත්‍රණ මාලාව.**

| අනු අංකය | ස්ථානය | ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගණන | වියදම (රු.) |
|---|---|---|---|
| 1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කළුතර | 1004 | 140,291.00 |
| 2 | විහාරමහාදේවි බාලිකා විද්‍යාල කිරිබත්ගොඩ | 265 | 66,563.00 |
| 3 | විවේකානන්ද විද්‍යාල කොළඹ | 225 | 60,200.00 |

| | | | |
|---|---|---|---|
| **4** | ආනන්ද මහා විද්‍යාලය ඇල්පිටිය | 152 | 52,000.00 |
| **5** | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 702 | 101,400.00 |
| **6** | වීරකැටිය රාජපක්ෂ විද්‍යාලය | 750 | 103,395.00 |
| **7** | වයඹ රාජකීය විද්‍යාලය | 423 | 71,500.00 |
| **8** | පුත්තලම සහිරා විද්‍යාලය | 362 | 61,354.00 |
| **9** | මැදිරිගිරිය ජාතික පාසැල සහ මුස්ලිම් විද්‍යාලය | 302 | 58,310.00 |
| **10** | අනුරාධපුර නිවර්තන චෛතිය සහ පලිසිංහ හරිස්චන්ද්‍ර විද්‍යාලය | 352 | 67,155.00 |
| **11** | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පාතදුම්බර | 259 | 63,389.00 |
| **12** | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මාතලේ | 285 | 50,197.00 |
| **13** | සෙන්. මේරි විද්‍යාලය කෑගල්ල | 550 | 82,879.00 |
| **14** | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 300 | 94,137.00 |
| **මුළු එකතුව** | | **5931** | **1,072,770.00** |

**<u>භාෂා පරිවර්තන ඩිප්ලෝම පාඨමාලාව</u>**

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය පනත යටතේ භාෂා හා භාෂා පරිවර්තකයින් පුහුණු කිරිම මෙම ආයතනයේ ප්‍රධාන වගකීම වේ .

ඒ අනුව 2019.05.26 දින මාකුඹුර පිහිටි ප්‍රධාන කාර්යාලයේ දි පාඨමාලාලාභීන් 44 දෙනෙකු සඳහා මෙම පාඨමාලාව ආරම්භ කරන ලද අතර එක් පාඨමාලාලාභියකුගෙන් රු .40,000ක පාඨමාලා ගාස්තුවක් අය කෙරේ .

**<u>දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝම පාඨමාලාව</u>**

දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව හැදෑරු පාඨමාලාලාභීන් සඳහා මෙය පැවැත්වේ. ඒ අනුව 2019 වර්ෂය තුල මෙම පාඨමාලාව සඳහා 47ක් ලියාපදිංචි වූ අතර එක් අයෙකුගෙන් රු.20,000ක ගාස්තුවක් අය කෙරේ.

**<u>ලියාපදිංචි බලයලත් ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද භාෂා පුහුණු වැඩසටහන්</u>**

භාෂා ඉගැන්වීමේ කාර්ය වඩාත් පුළුල් කිරීම සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව පෞද්ගලික ආයතන ලියාපදිංචි කරන ලද අතර 2019 වර්ෂය තුල එම ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද පාඨමාලා පහත දැක්වේ.

| පාඨමාලාව | පාඨමාලාගණන | පාඨමාලාලාභීන් ගණන | වියදම (රු.) |
|---|---|---|---|
| පැය 50 භාෂා පුහුණු පාඨමාලාව | 14 | 802 | |
| පැය 100 භාෂා පුහුණු පාඨමාලාව | 50 | 3273 | |
| මුළු එකතුව | 64 | 4075 | |

## 08.3 අභ්‍යන්තර විගණන අංශය

**හැඳින්වීම**

අභ්‍යන්තර විගණන ඒකකය ආයතනයේ මුදල් හා ගිණුම් කටයුතු නියම වශයෙන්ම කරගෙන යන්නාවූ නොහොත් ඒ කටයුතු සඳහා වගකීමට බැඳි ඇත්තාවූ අයගේ මෙන්ම යෝජනා ක්‍රමවල හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ හෝ ආයතනය තුල වැඩ හෝ සේවාවන් ඉටුකිරිමෙහි හෝ නියුක්ත වූ අයගේද පාලනයෙන් නිදහස්ව වෙනමම ස්වාධීන ඒකකයක් ලෙස ක්‍රියාත්මක වේ.

මුදල් හා ගිණුම්කරණ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනය සෘජුවම ආයතන ප්‍රධානියා වෙත වාර්තා කිරිම අත්‍යවශ්‍ය වේ.

අභ්‍යන්තර විගණන ඒකකයේ ව්‍යාපෘති සහ යෝජනා සම්බන්ධයෙන් විගණන කටයුතු අභ්‍යන්තර විගණන සැලැස්මකට අනුව සිදුවන අතර ආයතනයේ මුදල් කටයුතු වලට අදාල අංශයන් සමීක්ෂණයට භාජනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර ඒ අනුව කටයුතු කරනු ලබයි.

**<u>අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්යයන් සහ ඒවායේ විෂය සීමාව</u>**

- වැරදි සහ වංචා වැලැක්වීම සඳහා ආයතනය තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි සහ පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන්ම තත්‍ය ක්‍රියාකාරිත්වය අතින් සාර්ථකම දැයි සොයා බැලීම.

- ගිණුම් සහ වෙනත් වාර්තා වල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම සහ යොදාගෙන ඇති ගිණුම්කරණ පිළිවෙත මගින් නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේදැයි සොයා බැලීම.

- කාර්ය මණ්ඩලයට පවරා දී ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්යසාධනයෙහි ගුණාත්මකතාවය ඇගයීම.

- ආයතනය සතු වත්කම් සියලුම ආකාරයේ අලාභහානි වලින් කොතරම් දුරට ආරක්ෂා කර ඇත්දැයි සොයා බැලීම.

- රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ වරින්වර නිකුත්කරනු ලබන ආයතනයට අදාල චක්‍රෙල්ඛයන්හී උපදෙස් පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.

- නාස්තිය, නිස්කාර්ය ධාරිතාවය සහ පමණ ඉක්මවා කෙරෙන වියදම් වැලැක්වීමට මෙන්ම අනාවරණය කරගැනීමට තෝරාගනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

- අවශ්‍ය අවස්ථාවන්හී විශේෂ විමර්ශන පැවැත්වීම.

- ශිල්පීය හෝ ගිණුම්කරණ දෘෂ්ඨි කෝණයෙන් බාහිරව කළමනාකරණ දෘෂ්ඨි කෝණයකින් ආයතනයේ මෙහෙයුම් කාර්යයන් පිරික්සා බැලීම හා ඒ පිළිබද වාර්තා කිරීම.

- වැඩ, යෝජනා ක්‍රම හා ව්‍යාපෘති වල ප්‍රගතිය හා ඒ පිළිබද වැඩසටහන් හා කාලසටහන් කොතෙක් දුරට ඉලක්කයන් සාක්ෂාත් කිරීම කෙරෙහි යොමුවන්නේ දැයි සොයා බැලීම

**අභ්‍යන්තර විගණන සැලැස්ම**

ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ප්‍රධාන ක්‍රියාකාරකම්, වැඩසටහන් සහ ව්‍යාපෘතීන්ට අදාලව වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කරනු ලැබේ.

**අභ්‍යන්තර විගණන වැඩසටහන**

ආයතනයේ මුදල් කටයුතු පිළිබදව ක්‍රමවත් වූද, ප්‍රමාණවත් වූද, කාර්යක්ෂම වූද පරික්ෂාවක් කිරීමට හැකිවනු පිණිස ආයතනයේ මුල්‍යමය කටයුතු වලට අදාල අංශයන් සමීක්ෂණයට භාජනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කරනු ලැබේ.

**අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීම**

අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කරනුයේ ආයතනයේ සභාපතිවරයාටය. එම වාර්තාවන්හී පිටපත් රේඛීය අමාත්‍යාංශයටත් රජයේ විගණන කාර්යාලයටත් සහ මුදල් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවටත් යොමු කෙරේ. එම වාර්තාවන්හී අදාල කරුණු සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කරනු ලැබේ.

2019 අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කරන ලද ක්ෂේත්‍රයන්,

* භාෂා පුහුණු පාඨමාලා විගණනය

* සැලසුම් සැසි පිළිබඳ විගණනය

* ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම සහ අනෙකුත් ප්‍රසම්පාදන කටයුතු

* කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලබන ධාරිතා වර්ධන වැටසටහන්

* ආදායම් උත්පාදක වැඩසටහන්

* පුනරාවර්තන වියදම්

* කාර්ය මණ්ඩලයේ නිවාඩු

* වියදම් සම්බන්ධයෙන් පෙර විගණනයන් (Pre Audit)

* විශේෂ විමර්ශනයන් සිදුකර වාර්තා ඉදිරිපත් කිරීම

* විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

**2019 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අභ්‍යන්තර විගණන වාර්තා පහත පරිදි වේ.**

1.ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2019 වර්ෂයේ මුල් කාර්තුවේ කාර්යසාධන පරීක්ෂාව

2.ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2018 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන පරික්ෂාව

3. ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර සහ ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරණ නිලධාරින් සඳහා පවත්වන ලද නේවාසික භාෂා පුහුණු වැඩසටහන පිළිබඳ අභ්‍යන්තර විගණන පරික්ෂාව - 2019

4.වාහන භාවිතය සහ පාලනය පිළිබඳ අභ්‍යන්තර විගණන පරික්ෂාව - 2019

5.රු.1500 දෛනික දීමනාව මත තාවකාලික සම්බන්ධීකරණ සහකාරවරුන් 15 දෙනෙක් බඳවා ගැනීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - 2019

6.NILET Website Update සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරික්ෂාව 2019

7.ස්ථාවර වත්කම් පිලිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - 2019

8. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අගලවත්ත පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකව පවත්වන ලද ආදායම් උත්පාදිත වැඩසටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව

9.ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මගින් පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලා පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව

10. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මගින් පවත්වනු ලබන නේවාසික නොවන ආදායම් උත්පාදිත වැඩසටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව.

11. 2019 ජාතික අයවැය යෝජනා අනුව භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව

## අවදානම් කළමනාකරණය (Risk Management)

ආයතනයේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ හැඳින්වීම.

සෑම ආයතනයක්ම විවිධ අවදානම් වලට මුහුණ දෙමින් සිටී. මෙම අවදානම් කළමනාකරණය කළ යුතු අතර , ඒවා හොඳින් කළමනාකරණය කළහොත් , ඒවට උපරිම විභවතාවයක් ඇති වීමටත් හේතු සාධක ඇතිවනු ඇත.

මෙම අවදානම් මූලිකව මෙහෙයුම් සහ මූල්‍ය අවදානම් යටතේ වර්ග කළ හැකිය. මෙම අවදානම් වර්ගයන්හි සාරාංශයන්, එක් එක් කාණ්ඩය යටතේ එන විශේෂිත අවදානම් අංශයන් සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග පහත වගුවේ දක්වා ඇත.

| | අවධානම් සාධකයන් | ප්‍රතිපල | අවධානම් ඇගයිම් කිරීම |
|---|---|---|---|
| 1 | විභාග සැපයුම් ප්‍රමිතීන් සපුරාලීමට අසමත් වීම . | විභාගයේ ශිෂ්‍ය කාර්යසාධනය නොගැලපීම | විභාග කටයුතු පිළිබඳ අධීක්ෂණය . |
| 2 | අතාත්වික මානව සම්පත් ප්‍රවේශය | ඉගැන්වීම් කටයුතු වල ගුණාත්මක භාවය අඩු වීම | සම්පත්දායකයින්ගේසුදුසුකම් සමාලෝචනය |
| 3 | මූල්‍ය අවධානම | දුර්වල මූල්‍ය කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය මඟින් මූල්‍ය වගකීම සපුරා ගැනීමට සහ මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමටඅපොහොසත් වේවංචා සහ . සොරකම් අතිරේක වියදම් වැඩිවීම | ආදායම් මූලාශ්‍ර ,ඇතිකිරීම . ,අයවැය පාලනය කිරීම මෙහෙයුම් සමාලෝචනය |
| 4 | තොරතුරු පද්ධති යාවත්කාලීන නොවීම | තොරතුරු පද්ධති වලට බාධා පැමිණීම නිවරදි සහ සම්පූර්ණ තොරතුරු ලබා දීමට අසමත් වීමසහය සේවාවන්ට බාධා . පැමිණීම | තොරතුරු පද්ධතියක වර්තමාන සහ අනාගත අවශ්‍යතාවය පිළිබඳ නිරතුරු සමාලෝචනය කිරීම |
| 5 | පරිපාලන කටයුතු විධිමත් නොවීම | වාහන නඩත්තුවකාර්ය මණ්ඩල නිවාඩු , සම්පාදන කටයුතු ප්‍ර ,ඉදිකිරීම් .සම්බන්ධයෙන් බාධා පැමිණීම | අදාල ක්ෂ්ත්‍රෙයන් සම්බන්ධයෙන් අධීක්ෂණය කර නිර්දේශ සහිතව වාර්තා සැපයීම. |

**අභ්‍යන්තර පාලනය**

ආයතනයේ අභ්‍යන්තර විගණන පද්ධතියේ කාර්යක්ෂමතාවය අභ්‍යන්තර විගණන විසින් සහ බාහිර විගණන විසින්

සපයන ලද වාර්තා මඟින් ඇගයීමට ලක් කරනු ලැබේ.




**විගණන හා කළමනාකරණ කමිටු**

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේක අංක 55 (PED 55) අනුව කාර්තුවකට එක් රැස්වීම බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.ඒ අනුව 2019 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 3ක් පවත්වා ඇත

## 08.04 ගිණුම් අංශය

ආයතනයේ සියලුම මූල්‍ය පාලන සහ ගිණුම් කටයුතු සිදු කිරීම ගිණුම් අංශය මඟින් සිදු කරනු ලබයි. ආයතනයේ ප්‍රධාන මූල්‍ය විධායකයා අධ්‍යක්ෂ ජනරාල් වන අතර ගණකාධිකාරී විසින් මූල්‍ය කටයුතු ගිණුම් කටයුතු පිළිබඳ වගකීම දරනු ලබයි.

**ගිණුම් අංශයේ කාර්යයන්**

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට හා ගණන්දීමේ නිලධාරී ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට මූල්‍ය බැඳීම ඉටු කරලීමට සහ පාර්ලිමේතුව වෙත වගවීම දැරීමට සහාය වීම.

- රජයේ මූල්‍ය නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම.
- මූල්‍ය කළමනාකරණය ගිණුම්කරණ පාලන පද්ධතියක් පවත්වා ගෙන යාම.
- අයවැය පුරෝකථනය/ මූල්‍ය සැලසුම් සකස් කිරීම හා යාවත්කාලින කිරීම.
- කාලීන හා නිවැරදි මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම.
- වර්ෂ අවසාන ගිණුම් සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.
- බදු ප්‍රතිපත්තිවලට හා අනෙකුත් නෛතික අවශ්‍යතාවලට අනුකූල වීම.
- නිසි වේලාවට සේවක වැටුප් හා වේතන ගෙවීම

- ආයතනයේ පවත්වනු ලබන පාඨමාලාවල මූල්‍ය කටයුතු මෙහෙය වීම හා අවශ්‍ය මූල්‍ය පහසුකම් සම්පාදනය කර දීම.

### (1) ගිණුම්කරණ ප්‍රතිපත්ති

(1.1) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරනු ලබන අතර සුදුසු පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ සටහන් යටතේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිද යොදාගෙන ඇත.

(1.2) සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර අවබෝධ කර ගැනීමට අදාළව අවශ්‍ය වන පෙර වර්ෂවල සංසන්දනාත්මක තොරතුරුද මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ.

(1.3) දේපළ, පිරියත, හා උපකරණ

දේපළ, පිරියත, හා යන්ත්‍රෝපකරණවල අගය, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකමෙන් සමුච්චිත ක්ෂය වටිනාකම් අඩුකළ පසු අගයෙන්, වඩා අඩු අගයකට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ. මෙම වත්කම්වල පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත වටිනාකම්, ඒවායේ ඵලදායී ජීවකාලය තුළ සමානුපාතිකව බෙදීයන පරිදි පහත සඳහන් ක්ෂය අනුපාත මත ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලබයි.

| | අනුපාතය (%) |
|---|---|
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2.5 |
| ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 10 |
| යන්ත්‍ර සූත්‍ර, පිරියත හා උපකරණ | 20 |
| වාහන | 25 |
| පරිගණක | 25 |
| පුස්තකාල පොත් | 10 |

2014 වර්ෂය දක්වා අදාළ වත්කම් මිලදී ගත් වර්ෂයේදී එම සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය වෙන් කරන එම වත්කම් ඉවත් කිරීමේදී ඉවත් කරන සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය වෙන් කිරීම සිදු නොකරනු ලබයි. 2014 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් මිලදී ගත් / ඉවත් කළ දිනය පදනම් කර ගෙන ක්ෂය වෙන් කිරීම සිදු කෙරේ.

(1.4) පාරිතෝෂික සඳහා වෙන් කිරීම

සේවකයකු සේවයට බඳවා ගත් දින සිට සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ කළ සියලුම සේවා භවතුන්ගේ පෙර ගිණුම් වර්ෂයේ අවසාන මාසයේදී ලබාගත් මාසික වැටුපෙන් භාගයකට සමාන වටිනාකම පදනම් කරගෙන පාරිතෝෂික මුදල් වෙන් කිරීම් සිදු කරනු ලබන අතර 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව පාරිතෝෂික මුදල් ගෙවීමට බැඳීමක් ඇති වන්නේ අවුරුදු 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයකු සේවයෙන් ඉවත්වීමේදීය.

(1.5) ලැබිය යුතු ශේෂ

ලැබිය යුතු ගිණුම් ශේෂ, අපේක්ෂිත උපලබ්ධි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර ගිණුම් වර්ෂ අවසානයේදී ලැබිය යුතු ගිණුම් ශේෂවලින් උපලබ්ධි වීම අනපේක්ෂිත අගයන් පුරෝකථනය කරනු ලබයි. බොල් ණය ලෙස හඳුනා ගන්නා ණය ගැති ශේෂ එසේ හඳුනා ගත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම කරනු ලබයි.

(1.6) මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී, අතැති මුදල්, බැංකු තැම්පතු, බැංකු අයිරා වටිනාකම් යන දෑ මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගන්නා අතර මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ බැංකු අයිරා වටිනාකම් පෙන්නුම් කරනු ලබයි.

(1.7) ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු සිදුවී ඇති සිදුවීම්වලින් මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇතිකරන සිද්ධීන්වල බලපෑම මූල්‍ය ප්‍රකාශනවල අදාළ පරිදි ගැළපීම් කර ඇති අතර ඇතැම් සිදුවීම් හෙළිදරව් කිරීම් ලෙස ගිණුම්කරණ සටහන් යටතේ දක්වා ඇත.

(1.8) බැරකම් වෙනුවෙන් වෙන් කිරීම

මූල්‍ය තත්ව ප්‍රකාශය පිළියෙල කරන දින වන විට නිශ්චිතව ගණනය කළ හැකි සියලු බැරකම් අගය මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වන අතර වටිනාකම නිශ්චිතව නිර්ණය කළ නොහැකි බැරකම් වෙනුවෙන් අවශ්‍ය පරිදි වෙන් කිරීම් සිදු කර ඇත.

(1.9) සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල වෙනුවෙන් වෙන් කිරීම.

සේවක හවතුන්හට සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල් වෙනුවෙන් හිමිකමක් ඇති අතර පිළිවෙළින් දළ වැටුපෙන් 12% ක් හා 3% ලෙස ආයතනය විසින් දායක මුදල් ගෙවනු ලැබේ.

(1.10) ආදායම

1.10.1 පුනරාවර්ථන ආදායම ලෙස ලැබෙන රාජ්‍ය ප්‍රදාන

මහා භාණ්ඩාගාරය මඟින් පුනරාවර්ථන වියදම් වෙනුවෙන් ලැබෙන ප්‍රදාන ආයතනයේ ආදායමක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන අතර, ආයතනයේ සියලු ආදායම්, විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කෙරේ.

1.10.2 ප්‍රාග්ධන හා ප්‍රදාන

මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබා දෙන ප්‍රදාන මෙහි ඇතුළත් වන අතර, ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මෙමඟින් සිදු කරනු ලබයි.

(1.11) වියදම්

ආයතනය දෛනික කටයුතු පවත්වා ගෙන යාම වෙනුවෙන් දරන පුනරාවර්ථන වියදම් හා ආදායම් උත්පාදිත ක්‍රියාකාරකම් වෙනුවෙන් අදාළ වර්ෂයේදී දරන ලද සියලු වියදම් මේ යටතේ පෙන්නුම් කෙරේ.

(1.12) තොග

පාඨමාලාවලට අදාළ පොත්පත්, ලිපි ද්‍රව්‍ය ඇතුළු සියලුම තොග අගයන් පිරිවැය වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ.

**(2) මූල්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම්**

2.1.1 2014 වර්ෂය දක්වා ක්ෂය කිරීමේදී අනුගමනය කළ මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය වෙන්කිරීමේ හා වත්කම් ඉවත් කරන වර්ෂයේදී එම ඉවත් කරන සම්පූර්ණ වර්ෂයටම ක්ෂය වෙන් නොකිරීමේ ප්‍රතිපත්තිය 2014 වර්ෂයෙන් පසු අදාළ වත්කම් මිලට ගත් දිනය හෝ ඉවත් කළ දිනය සලකා ක්ෂය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය දක්වා වෙනස් කර ඇත.

**(3) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී "වක්‍ර ක්‍රමය" අනුගමනය කරන අතර මුදල් හා මුදල් සමාන දෑ තුළ බැංකු ශේෂ / අයිරා වටිනාකම්ද ඇතුළත් කර ඇත.

**<u>2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය</u>**

| | සටහන | 2019<br>Rs. | 2018<br>Rs. |
|---|---|---|---|
| ආදායම | | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 01 | 93,925,419 | 87,539,810 |
| අමාත්‍යාංශ ප්‍රතිපාදන | 01 | 5,773,800 | 49,887,161 |
| වෙනත් ආදායම් | 02 | 44,112,967 | 44,344,097 |
| | | 143,812,186 | 181,771,068 |
| වියදම් | | | |
| පරිපාලන වියදම් | 03 | (73,467,406) | (65,311,243) |
| පුහුණු වැඩසටහන් සඳහා වියදම් | 04 | (68,224,969) | (75,608,626) |
| මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය/ (ඌනතාවය) | | 2,119,811 | 40,851,199 |
| මූල්‍ය වියදම් | 05 | (113,639) | (54,514) |
| බදු පෙර අතිරික්තය /(ඌනතාවය) | | 2,006,172 | 40,796,685 |

| | | | |
|---|---|---|---|
| බදු | | - | - |
| බදු අතිරික්තය / (ඌනතාවය) | | 2,006,172 | 40,796,685 |

## 2019.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන | 2019<br>Rs. | 2018<br>Rs. |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 06 | 57,560,882 | 39,312,402 |
| ගොඩනැගිලි - කෙරී ගෙන යන වැඩ | | 710,171 | 11,986,375 |
| ජංගම වත්කම් | | | |
| වෙළඳ හා අනිකුත් ලැබිය යුතු වටිනාකම් | 07 | 11,171,031 | 23,101,527 |
| තොග- ලිපි ද්‍රව්‍ය හා පරිභෝජන භාණ්ඩ | | 1,270,755 | 1,249,058 |
| මුදල් හා සමාන දෑ | 08 | 56,178,156 | 39,396,092 |
| | | 68,619,942 | 63,746,677 |
| මුළු වත්කම් | | 126,890,995 | 115,045,453 |
| අරමුදල්, සංචිත හා වගකීම් | | | |
| ප්‍රාග්ධනය | | 13,015,468 | 13,015,468 |

| | | | |
|---|---|---|---|
| සමුච්චිත අතිරික්තය / (ඌනතාවය) | | 43,096,339 | 41,495,192 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 47,000,892 | 32,526,407 |
| | | 103,112,699 | 87,037,066 |
| ජංගම නොවන බැරකම් | | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 3,712,093 | 2,724,222 |
| | | 3,712,093 | 2,724,222 |
| ජංගම බැරකම් | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ | 09 | 19,130,460 | 24,498,252 |
| උපචිත වියදම් | 10 | 935,743 | 785,913 |
| | | 20,066,203 | 25,284,165 |
| මුළු අරමුදල් සහ බැරකම් | | 126,890,995 | 115,045,453 |

## 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

| | දායක ප්‍රාග්ධනය | සමුච්චිත අතිරික්තය / (ඌනතාවය) | ප්‍රත්‍යාගණන සංචිත | එකතුව |
|---|---|---|---|---|
| | (රු) | (රු) | (රු) | (රු) |
| වර්ෂය තුල පුහුණු ක්‍රියාකාරකම් සඳහා වැය වූ මුදල | | | | |
| **2018.01-.01 දිනට ශේෂය** | **13,015,468** | **(7,434,832)** | **32,526,407** | **38,107,043** |
| පෙර වර්ෂයේ ගැළපිලි | | 8,133,339 | | 8,133,339 |
| වර්ෂය සඳහා හිඟ අතිරික්තය | | 40,796,685 | | 40,796,685 |
| **2018-12-31ට ශේෂය** | **13,015,468** | **41,495,192** | **32,526,407** | **87,037,067** |
| පෙර වර්ෂයේ ගැළපිලි | - | (405,025) | - | (405,025) |
| වර්ෂය සඳහා හිඟ අතිරික්තය | - | 2,006,172 | 14,474,485 | 16,480,658 |
| **2019-12-31ට ශේෂය** | **13,015,468** | **43,096,339** | **47,000,892** | **103,112,700** |

## 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2019 | 2018 |
|---|---|---|
| | Rs. | Rs. |
| බදු පෙර අතිරික්තය / (ඌනතාවය) | **2,006,172** | 40,796,685 |
| වත්කම් ඉවත්කිරිමෙන් ලද අලාභය | | |
| ක්ෂය | **11,235,735** | 9,678,387 |
| පෙර වර්ෂයේ ගැළපිලි | **(405,025)** | - |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | **1,171,272** | 354,841 |
| වෙනත් ආදායම් | - | - |
| කලින් ගෙවීම සඳහා ගැළපීම | - | - |
| ගෙවිය යුතු ඉන්ධන සඳහා ගැළපීම | - | - |
| | **14,008,153** | 50,829,913 |
| පොළී ආදායම | **(1,672,783)** | (803,260) |
| පාරිතෝෂික ගෙවීම් | **(183,400)** | (101,100) |
| කාරක ප්‍රාග්ධන විචලනයට පෙර මෙහෙයුම් ලාභය/ අතිරික්තය | **12,151,970** | 49,925,553 |
| කාරක ප්‍රාග්ධන විචලනයන් | | |
| වෙළඳ හා ලැබිය යුතු ශේෂ වැඩි වීම හා අඩු වීම | **11,930,496** | (16,668,746) |
| වෙළඳ හා ලැබිය යුතු ශේෂ වැඩි වීම හා අඩු වීම | **(5,217,962)** | (5,197,251) |
| තොග අඩුවීම් හා වැඩිවීම් | **(21,697)** | (266,398) |

| | | |
|---|---|---|
| | **18,842,806** | 27,793,158 |
| මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ ප්‍රවාහය | **18,842,806** | 27,793,158 |
| ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහයන් | | |
| දේපළ පිරියත හා උපකරණ අත්පත් කරගැනීම | **(15,009,728)** | (5,659,147) |
| කෙරීගෙන යන වැඩ | **11,276,204** | (9,875,030) |
| වත්කම් විකිණීමෙන් ලද මුදල් ප්‍රවාහය | **-** | - |
| පොළී ආදායම් | **1,672,783** | 803,260 |
| ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ ලාභය | **(2,060,742)** | (14,730,917) |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ ප්‍රවාහයන් | **16,782,064** | (16,689,747) |
| මුල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය | **39,396,092** | 19,441,420 |
| වර්ෂ අවසානයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ (සටහන ආ) | **56,178,156** | 2,751,673 |
| | | - |

සටහන ආ - මුදල් හා මුදල් සමාන දෑ

| | | |
|---|---|---|
| | **Rs.** | Rs. |
| බැංකුවේ මුදල් | **56,178,156** | 39,396,092 |
| | **56,178,156** | 39,396,092 |
| | **56,178,156** | 39,396,092 |

## 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| සටහන් 01 - ආදායම | 2019 | 2018 |
|---|---|---|
| | Rs. | Rs. |
| අයභාර වියදම් සඳහා ප්‍රදාන | 58,200,419 | 55,993,810 |
| ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රදාන<br>- | | |
| පුහුණු පාඨමාලා සඳහා භාණ්ඩාගාරයෙන් ලැබීම් | 35,725,000 | 31,546,000 |
| රේඛිය අමාත්‍යාංශයේ ලැබීම් | 5,773,800 | 49,887,161 |
| | 99,699,219 | 137,426,971 |

## සටහන් 02 - වෙනත් ආදායම්

| | Rs. | Rs. |
|---|---|---|
| පුහුණු පාඨමාලා අදායම් | 41,529,813 | 42,727,270 |
| ලියාපදිංචි ගාස්තු | - | 60,000 |
| විභාග ගාස්තු | - | 46,000 |
| ටෙන්ඩර් තැම්පතු - ආපසු නොගෙවන | 93,000 | 116,000 |
| පොළී ආදායම් | 1,672,783 | 803,260 |
| වැටුප් රහිත නිවාඩු හා වැටුපෙන් අඩුකිරීම | 84,093 | 133,634 |
| ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුවෙන් ලද ආදායම | - | 186,000 |
| වාහන දීමනා මත රජයේ ගාස්තු | - | 4,200 |
| ශාලා ගාස්තු | 228,340 | 10,000 |
| නිවාස පහසුකම් මත රජයේ ගාස්තු 10% | - | 50,136 |
| විදුලි බිල්පත් මත රජයේ ගාස්තු | - | 6,000 |

| | | |
|---|---|---|
| විවිධ ආදායම් | 504,938 | 201,598 |
| | 44,112,967 | 44,344,097 |

**සටහන් 03 - පරිපාලන වියදම්**

| | 2019 | 2018 |
|---|---|---|
| | Rs. | Rs. |
| **සේවක සංවේතන** | | |
| වැටුප් හා වේතන | 18,675,020 | 16,296,094 |
| සේ.අ.අ. 12% | 2,236,125 | 1,921,377 |
| සේ.භා.අ. 3% | 558,270 | 480,344 |
| අතිකාල | 143,850 | 153,186 |
| නිවාඩු දින දීමනා | 62,293 | 45,808 |
| වෘත්තීය දීමනා | - | 168,000 |
| අනෙකුත් දීමනා | 512,921 | 338,775 |
| වාහන දීමනා | 600,000 | 600,000 |
| ඉන්ධන දීමනා | 620,125 | 654,170 |
| පුහුණුවන්නන් සඳහා දීමනා | 572,250 | 345,225 |
| සහභාගීත්ව හා ප්‍රවාහන දීමනා | 989,610 | 809,687 |
| සභාපති දීමනා | 713,050 | 902,248 |
| පාරිතෝෂික වියදම් | 1,171,272 | 354,841 |
| ප්‍රවාහන - දේශීය | 89,557 | 110,950 |

| | | |
|---|---|---|
| ප්‍රවාහන - විදේශීය | 207,045 | - |
| **සැපයුම්** | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය ද්‍රව්‍ය | 601,180 | 470,044 |
| ඉන්ධන | 524,774 | 484,940 |
| නිල ඇඳුම් | 24,000 | 10,675 |
| සංග්‍රහ වියදම් | 195,502 | 287,740 |
| පුවත්පත් හා වෙනත් | 6,271 | - |
| **නඩත්තු වියදම්** | | |
| වාහන | 1,551,681 | 1,024,354 |
| දේපළ හා පිරියත | 329,396 | 173,350 |
| පරිගණක | 211,788 | 10,350 |
| ගොඩනැගිලි | 77,310 | 147,205 |
| කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ | 8,395 | 420 |
| **සේවා** | | |
| තැපැල් හා සන්නිවේදන | 854,518 | 733,425 |
| විදුලිය | 1,437,855 | 1,006,277 |
| ජලය | 179,958 | - |
| බදු සහ කුලී ගෙවීම් | 17,473,750 | 17,212,500 |
| ප්‍රවාහන | 97,756 | 44,149 |
| ආරක්ෂණ සේවා | 2,576,928 | 2,584,510 |

| | | |
|---|---|---|
| පවිත්‍රතා සේවා | 3,535,597 | 2,777,174 |
| වෙළඳ ප්‍රචාරණ | 536,142 | 800,820 |
| සුභසාධන හා පරිපාලන වියදම් | 155,369 | |
| මෙහෙයුම් කල් බදු | 3,838,334 | 3,863,762 |
| විගණන ගාස්තු | 419,090 | - |
| වෙනත් | 444,691 | 820,458 |
| **ක්ෂය** | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 524,994 | 492,544 |
| දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ | 2,129,742 | 2,085,860 |
| ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,224,577 | 1,015,436 |
| වාහන | 5,332,192 | 5,512,500 |
| පුස්තකාල පොත් | 9,917 | 68,587 |
| පරිගණක | 2,014,312 | 503,460 |
| | 73,467,406 | 65,311,243 |

## සටහන් 04 - පුහුණු වැඩසටහන් සඳහා වියදම්

| | 2019<br>Rs. | 2018<br>Rs. |
|---|---|---|
| සම්පත්දායක දීමනා | 16,365,034 | 21,522,250 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 3,136,375 | 2,180,435 |

| | | |
|---|---|---|
| තැපැල් හා සන්නිවේදන | 757,187 | 943,566 |
| ආහාර හා සංග්‍රහ කටයුතු | 9,604,214 | 21,168,481 |
| නවාතැන් පහසුකම් | 743,889 | 5,443,524 |
| වැඩසටහන් පාලන සහ සම්බන්ධිකරණ දීමනා | 698,956 | - |
| සහතිකපත් මුද්‍රණ ගාස්තු | 6,708,482 | 3,753,753 |
| සහයක සේවා | 208,350 | 392,058 |
| අතිකාල | 747,224 | 814,107 |
| නිවාඩු දින දීමනා | 343,551 | 307,656 |
| ඉන්ධන | 953,366 | 1,577,937 |
| අතිරේක ඉන්ධන | - | - |
| විදුලිය | 971,815 | 1,331,021 |
| ජලය | 337,310 | 302,740 |
| ගමන් වියදම් - දේශීය | 724,430 | 571,284 |
| වාහන නඩත්තු | 200 | 146,631 |
| පරිගණක නඩත්තු | 3,500 | - |
| යන්ත්‍රෝපකරණ හා පිරියත නඩත්තු වියදම් | 62,270 | 40,275 |
| ගොඩනැගිලි නඩත්තු | 71,332 | 99,738 |
| ලී බඩු උපකරණ නඩත්තු | - | 10,400 |
| ගමන් හා සහභාගිත්ව දීමනා | 20,130 | 682,810 |
| ගුවන්විදුලි හා රූපවාහිනි වැඩසටහන් | 20,990,247 | 9,937,082 |
| ප්‍රවාහන | - | 94,670 |
| සේවක මණ්ඩල පුහුණු | 206,300 | 466,050 |

| | | |
|---|---|---|
| දැන්වීම් ගාස්තු | 829,567 | 1,647,997 |
| නේවාසිකාගාර අවශ්‍යතා | 237,517 | 36,660 |
| ශාලා ගාස්තු | 1,080,799 | 1,963,672 |
| පරිවර්තන හා විභාග ගාස්තු | 50,000 | 17,500 |
| පුහුණුවන්නන් සහ අනියම් සේවක ගෙවීම් | 2,328,750 | |
| බැංකු ගාස්තු | 8,850 | 37,760 |
| වෙනත් සේවා | 35,326 | 118,570 |
| | 68,224,969 | 75,608,626 |

## සටහන් - 05

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 30,000 | 7,610 |
| ඉතුරුම් පොළී මත රඳවා ගැනීමේ බද්ද | 83,639 | 46,904 |
| | 113,639 | 54,514 |

## සටහන - 06

| දේපළ පිරියත හා උපකරණ | ක්ෂය අනු පාතය | මුළු පිරිවැය 2019.01.01 | වර්ෂය තුල ඉවත් කිරීම් | ගැලපීම් | **මුළු පිරිවැය 2019.12.31** | සම්මුච්චිත ක්ෂය 2019.01.01 | ගැලපීම් | වර්ෂය සඳහා ක්ෂය | **Accu. Dep. As At 31.12.2019** | **WD Value As At 31.12.2019** |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු | රු | රු | රු | රු | රු | රු | රු | රු |
| ඉඩම් | - | 615,000 | - | - | **615,000** | - | - | - | - | **615,000** |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2.5% | 20,986,199 | 4,956,546 | - | **25,942,745** | 1,157,897 | - | 524,994 | **1,682,892** | **24,259,853** |
| යන්ත්‍ර සූත්‍ර පිරියත හා උපකරණ | 20% | 10,620,221 | 2,841,825 | - | **13,462,046** | 8,500,330 | - | 2,129,742 | **10,630,072** | **2,831,974** |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල පකරණ | 10% | 12,226,741 | 6,947,052 | - | **19,173,793** | 6,660,455 | - | 1,224,577 | **7,885,032** | **11,288,761** |
| වාහන | 25% | 22,050,000 | - | (2,250,000) | **19,800,000** | 12,979,006 | (16,724,485) | 5,332,192 | **1,586,712** | **18,213,288** |
| පුස්තකාල පොත් | 10% | 1,343,352 | - | - | **1,343,352** | 1,333,435 | - | 9,917 | **1,343,352** | **-** |
| පරිගණක | 25% | 8,052,639 | 264,305 | - | **8,316,944** | 5,950,626 | - | 2,014,312 | **7,964,938** | **352,006** |
| | | 75,894,151 | 15,009,728 | (2,250,000) | **88,653,881** | 36,581,750 | (16,724,485) | 11,235,735 | **31,092,999** | **57,560,882** |

**සටහන් - 07 දේපළ හා වෙනත් ලැබිය යුතු ශේෂ**

| | 2019 | 2018 |
|---|---|---|
| | Rs. | Rs. |
| අත්තිකාරම් - ප්‍රාග්ධන වැඩසටහන් | - | 100,000 |
| අත්තිකාරම් - ආදායම් උප්පාදිත වැඩසටහන් | 30,000 | - |
| හේවාසිංහ මහතාගෙන් ලැබිය යුතු ශේෂ | 58,983 | 58,983 |
| ප්‍රදීප් මහතාගෙන් ලැබිය යුතු ශේෂ | - | 19,898 |
| තුරම් මහතාගෙන් ලැබිය යුතු ශේෂ | 17,163 | 17,163 |
| නාපාවල මහත්මියගෙන් ලැබිය යුතු ශේෂ | 9,650 | 9,650 |
| වික්‍රමසිංහ මහතාගෙන් ලැබිය යුතු ශේෂ | 9,650 | 9,650 |
| ආයතන වෙබ් අඩවිය සඳහා ගෙවූ අත්තිකාරම් | 93,000 | - |
| තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබියයුතු ශේෂ | 22,000 | - |
| ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂ | 900,000 | - |
| තැම්පතු | 141,500 | 141,500 |
| බුද්ධ ශාසන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ | 165,000 | 165,000 |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ | 7,433,800 | 8,378,000 |
| රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ | 2,290,285 | 14,201,683 |
| | 11,171,031 | 23,101,527 |

**සටහන් - 08 මුදල් හා මුදල් හා සමාන දෑ**

| | Rs. | Rs. |
|---|---|---|
| ලංකා බැංකු ගිණුම් අංක C/A 0007442918 | | |
| ප්‍රාග්ධන | 309 | 643,419 |
| පුනරාවර්තන | 475,102 | 2,562,518 |
| අමාත්‍යාංශ වැඩසටහන් | 270 | 478,150 |
| ආදායම් | 4,433,782 | 217 |
| භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීම | 6,150 | |
| ඉතිරි කිරීමේ ගිණුම - BOC 79712746 | 51,262,544 | 35,711,789 |
| | 56,178,156 | 39,396,092 |

**සටහන් - 09**

| | Rs. | Rs. |
|---|---|---|
| ටෙන්ඩර් තැම්පතු - ආපසු ගෙවිය යුතු | 202,000 | 262,000 |
| සම්පත්දායක දීමනා | 6,655,048 | 12,676,670 |
| ඉන්ධන | 141,500 | 201,000 |
| මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා) | 282,725 | 76,660 |
| ආහාර හා සංග්‍රහ කටයුතු | - | 1,108,051 |
| ප්‍රවාහන | - | - |

| | | |
|---|---|---|
| වාහන නඩත්තු | - | - |
| නවාතැන් ගාස්තු | - | 2,050,882 |
| තැපැල්/ කුරිය හා සන්නිවේදනය | 128,595 | - |
| ගමන් වියදම් - දේශීය | 5,862 | 40,808 |
| අතිකාල | 72,225 | 72,225 |
| අත්පොත් මුද්‍රණය | | |
| පර්යේෂණ වියදම් | | |
| වික්‍රමාරච්චි කන්ස්ට්‍රක්ෂන් අගලවත්ත කාර්යාල අලුත්වැඩියා | 637,946 | 637,946 |
| ණය හිමියන් | 2,814,563 | |
| ගෙවිය යුතු මුද්දර බදු | - | 11,125 |
| ගෙවිය යුතු රඳවා ගැනීම් බදු | 13,495 | 70,674 |
| ලීමා ක්‍රියේෂන් - අභ්‍යන්තර සැකසීම් | 4,039,290 | 5,585,155 |
| ඇප තැම්පතු මුදල් ආපසු ගෙවීම | 44,886 | |
| වෙනත් | - | 17,500 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 360,000 | 620,190 |
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ ලක්දිත ඈ ඇඩ්වටයිසින් | 2,959,496 | 731,789 |
| වැටුප්, සේ.අ.අ.හා.සේ.හා මණ්ඩල සඳහා වෙන් කිරීම් | 772,830 | 335,577 |
| | 19,130,460 | 24,498,252 |

**සටහන - 10**

| | 2019 | 2018 |
|---|---|---|
| | Rs. | Rs. |
| දේශීය ගමන් ගාස්තු | - | 1,226 |
| තැපැල් හා සන්නිවේදන | - | 179,759 |
| විදුලි ගාස්තු | 77,597 | 179,964 |
| ජලය | 2,676 | |
| ආරක්ෂණ සේවා | 221,229 | - |
| ශාලා ගාස්තු හා ශබ්විකාශන | - | 62,000 |
| අතිකාල | - | 787 |
| නිවාඩු දින දීමනා | 70,248 | 6,305 |
| පුහුණු දීමනා | 9,500 | |
| ජල වියදම් | - | 2,924 |
| පවිත්‍රතා සේවා | 277,972 | 20,800 |
| දැන්වීම් ගාස්තු | - | 105,628 |
| තාක්ෂණික වාර්තා ගාස්තුව | 50,000 | |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 226,521 | 226,521 |
| | 935,743 | 785,913 |

**සටහන් - 11**

| | 2019 | 2018 |
|---|---|---|
| පරිගණක සමුච්චිත ක්ෂය අයි වෙන් කිරීම් | - | 1,240,907 |
| උපචිත බිල්පත් අයි වෙන් කිරීම් | (405,025) | 5,243,274 |
| වැඩ තහනම් කළ අධ්‍යයන හා පර්යේෂණ නිලධාරීවරයාට අදාළ වෙන් කිරීම් | - | 1,649,158 |
| | (405,025) | 8,133,339 |

**සටහන 12 - හේවාසිංහ මහතා සම්බන්ධ නඩු කටයුතු**

රජයේ මුදල් අයතා භාවිතය හා කූට ලේඛන ඉදිරිපත් කිරීම හේතුවෙන් සහකාර අධ්‍යක්ෂකවරයකු 2010 පෙබරවාරි 02 වන දින සිට සේවයෙන් පහ කර ඇති අතර ඊට අදාළව කඩුවෙල අධිකරණයේ නඩුවක් 2011 වර්ෂයේ සිට විභාග වෙමින් පවති. (නඩු අංක: LT/30/1491/2011) සමතයකට පත් කර ඇති අතර, කළමනාකරණ මණ්ඩල තීරණයකට අනුව 2019.10.28 දින සිට තාවකාලික පදනම මත අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි තනතුර සඳහා පත්කර ඇත.

**සටහන 13– 2015, 2016 හා 2019 කාල පරිච්ඡේද තුළ වැඩ තහනම් කරන ලද නිලධාරීන්**

2015 වර්ෂයේ ආයතනයේ සේවකයින් දෙදෙනෙකුගේ වැඩ තහනමකට ලක් කර ඇත. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2015.03.19 සිට 2015.07.06 දක්වාද අධ්‍යයන හා පරිපාලන නිලධාරිවරයාගේ 2015.08.10 දින සිටද සේවය තහනම් කර ඇති අතර 2018.09.23 දින කළමනාකරණ මණ්ඩල තීරණයක් මඟින් එම අධ්‍යයන නිලධාරිවරයාගේ සේවය අත්හිටුවා ඇත. ඒ අනුව වැටුප්, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල් වෙන් කිරීම් ශේෂය තුළ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉහත කාලසීමාවට අදාළ වෙන් කිරීම් ඇතුළත් වේ.

**සටහන 14 - ආයතනයේ වෙබ් අඩවිය නිර්මාණය කිරීම**

ආයතනයේ නිල වෙබ්අඩවිය සකස් කරමින් පවතින අතර ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනය වෙත රු: 93000.00ක අත්තිකාරම් මුදලක් ගෙවා ඇත. මෙම කාර්යයේ සම්පූර්ණ වටිනාකම රු: 46500 0.00කි.

**සටහන 15 - අයවැය යෝජනා - 2019 භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන**

අයවැය යෝජනා 2019 හා කැබිනට් පත්‍රිකා අමප/19/2673/131/018-I අනුව භාෂා පුහුණු කිරීමේ වැඩසටහන ආරම්භ කර ඇති අතර මහාභාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම මත ආයතනයේ උත්පාදිත ආදායම් මඟින් රු: 4, 894,709.64ක බිල්පත් පියවා ඇති අතර රු: 37,395, 922ක බිල්පත් ආයතනය වෙත ලැබිය යුතුව ඇත. භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම මත මෙම වැඩසටහන අත්හිටුවා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊඑවල්/බී/එන්අයිඑල්ඊටී/ එල්එස්/19/43

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021 ඔක්තෝබර් 04 දින

සභාපති

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාද වීම හේතුවෙන් ආයතනය සම්බන්ධ ගනුදෙනු පිළිබඳ වාර්තාව 2021 පෙබරවාරි 18 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 5,722,770ක්වූ පරිගණක උපාංග සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනය සතු ඉඩමෙහි පිරිවැය වටිනාකම වූ රු. 615,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම ඉඩමෙහි සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 ජුනි සිට 2018 ජනවාරි මාසය දක්වා ආරක්ෂක සේවා ලබා ගැනීම වෙනුවෙන් හා සමාලෝචිත වර්ෂයේ රූපවාහිනී හා ගුවන්විදුලි වැඩසටහන් වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු. 648,504 වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශවල ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. එම නිසා ඉහත අගයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වැඩියෙන් දැක්වුණි.

(ඉ) 2017 වර්ෂයේදී වැරදි ලෙස කෙරීගෙන යන වැඩ (ගොඩනැගිලි) ගිණුමට ගලපා තිබූ රු.710,171 ක වටිනාකම සමාලෝචිත වර්ෂය තුළදීද, නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී.

ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමහ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.2 (ඉ) ඡේදයේ සඳහන් නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| (අ) 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනතේ 6 ඡේදයේ (ඊ) වගන්තිය | 2019 දෙසැම්බර් 31 දිනට ඉතුරුම් ගිණුමේ රු.51,262,544ක ශේෂය කලමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන කෙටිකාලීන හා දිගුකාලීන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 753(1) හා (2) | 2018 සහ 2019 අ.පො.ස (සා.පෙළ) සිසුන් සඳහා බස වඩමු - හද දිනමු අත්පොත් 22,500ක්, රු.6,615,000 ක් වැය කර මුද්‍රණය කර තිබුණද, මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර නොතිබුණි. |
| (ඇ)2018 ජුලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදී සම්බන්ධීකරණ සහායකවරුන් ලෙස උපාධිධාරීන් හා අභ්‍යාසලාභී පුහුණුවන්නන් 15 දෙනෙකු බඳවාගෙන රු. 1,475,675 ක මුදලක් චක්‍රලේඛයට පටහැනිව ගෙවීම් කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

සමාලෝචිත වර්ෂය තුළදී දන්නවනම් උගන්වන්න - දන්නේ නැත්නම් ඉගෙනගන්න වැඩසටහන ගුවන්විදුලියෙන් ප්‍රචාරය කිරීම වෙනුවෙන් හා සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් රු.15,323,972ක් හා රූපවාහිනී වැඩසටහන වෙනුවෙන් රු. 4,278,635 ක් වැය කර තිබුණු අතර මෙම සේවයන් ලබා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2, 6.3.3,8.9.1 හා 8.9.1. (ආ) මාර්ගෝපදේශවලින් බැහැරව කටයුතු කර තිබුණි.

## (ආ) අනෙකුත් විගණන නිරීක්ෂණ

---

(අ) 2016 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 වන දින දක්වා දන්නවනම් උගන්වන්න - දන්නේ නැත්නම් ඉගෙනගන්න වැඩසටහන වෙනුවෙන් ගුවන් විදුලි සංස්ථාවට ප්‍රචාරන වියදම් ලෙස රු.29,952,931ක් හා ගුවන්විදුලි වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් පෞද්ගලික ප්‍රචාරණ ආයතනයකට රු. 7,439,125ක් ගෙවා තිබුණි. ගුවන් විදුලි සේවාවන් 7 ක් ඔස්සේ දීප ව්‍යාප්තව මෙම වැඩසටහන ප්‍රචාරය කළද, අපේක්ෂිත පරිදි පාසල් ළමුන් අතර මෙම වැඩසටහන කොතරම් දුරට ප්‍රචලිතද යන්න හා අපේක්ෂිත අරමුණු කොතෙක් දුරට ඉටු වී ඇත්ද යන්න පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) අයවැය යෝජනාවක් අනුව භාෂා පුහුණුකරුවන් 1800ක් බඳවාගෙන පුහුණු කිරීම සිදුකිරිමට අවශ්‍ය මූලික කටයුතු සිදුකිරිම වෙනුවෙන් රු. 3,079,807ක වියදමක් දරා තිබුණි. මෙම වැඩසටහන අතරමඟ නවතා දැමීම හේතුවෙන් මෙතෙක් දරන ලද රු.3,079,807 ක වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණු අතරම, මෙම පුහුණු වැඩසටහන් ප්‍රාදේශියව පැවැත්වීම වෙනුවෙන් රු. 28,705,303 ක මුදලක් සඳහා ඉන්වොයිස්පත් ඉදිරිපත් කර තිබුණද, ගෙවීම්කර නොතිබුණි.

(ඇ) ආයතනය සතු රු. 350,000ක් වටිනා ත්‍රිවීල් රථය වර්ෂ 3ක කාලයක සිට හා රු.3,150,000 ක් වටිනා මෝටර් කාර් රථයක් සමාලෝචිත වර්ෂය තුළදීම ධාවනයට යොදාගෙන නොතිබුණි.

(ඈ)නිසි අවශ්‍යතාවයන් හඳුනාගැනීමකින් තොරව අගලවත්ත පුහුණු මධ්‍යස්ථානයට 2015 වර්ෂයේදී මිලදීගත් රු. 295,924 ක් වටිනා රෙදිසෝදන යන්ත්‍ර 2ක් 2020 වර්ෂයේ ජීව කාලය අවසන් වන තෙක් භාවිතයට ගෙන නොතිබුණි.

(ඉ) පෞද්ගලික ආයතන 3ක් වෙත භාණ්ඩ සැපයීම් වෙනුවෙන් ගෙවිය යුතු රු. 4,903,757 ක මුදලක් වසරකට වැඩි කාලයක් තිස්සේ නිරවුල් කර නොතිබුණි.

(ඊ) 2019 දෙසැම්බර් 31 දිනට රු.2,290,285 ක් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම් ගත කර තිබුණද, අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව කිසිදු බැරකමක් ගෙවීමට ඇති බව අමාත්‍යාංශය විසින් තහවුරු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති